# කාර්යසාධන වාර්තාව - 2015

# செயலாற்றுகைஅறிக்கை- 2015

# **Performance Report** - 2015

## වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## **வியாபாரமற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்**

## **Department of Trade and Investment Policy**

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය | நிதிஅமைச்சு | Ministry of Finance |
| කොළඹ - 01 | கொழும்பு - 01 | Colombo - 01 |

# 2015

# කාර්ය සාධන වාර්තාව

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

මුදල් අමාත්‍යාංශය

කොළඹ -01

# පටුන


1 හැඳින්වීම .................... 1

1.1 සංවිධාන රාමුව .................... 1

1.2 දැක්ම .................... 1

1.3 මෙහෙවර .................... 1

1.4 අරමුණු .................... 1

1.5 අභිමතාර්ථ .................... 2

1.6 සංවිධාන ව්‍යුහය .................... 3

1.7 කාර්යයන් .................... 4

1.7.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය .................... 4

1.7.1.1 වෙළඳ ප්‍රතිපත්ති .................... 4

1.7.1.2 නිදහස් වෙළඳ ගිවිසුම් .................... 4

1.7.1.3 තීරුබදු ප්‍රතිපත්ති .................... 5

1.7.1.4 පොදු ( වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති විෂයන් අතර පැතිකඩක්) .................... 6

1.7.2 ආයෝජන ප්‍රතිපත්ති අංශය .................... 6

1.7.3 පරිපාලන හා මූල්‍ය අංශය .................... 7

1.7.3.1 මානව සම්පත් පැතිකඩ .................... 7

2. ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම .................... 8

2.1 වෙළඳ ගිවිසුම් .................... 8

2.1.1 වෙළඳ ගිවිසුම් යටතේ අත්කරගෙන ඇති ප්‍රගතිය .................... 9

2.1.1.1 ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) .................... 9

2.1.1.2 පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) .................... 9

2.1.1.3 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) .................... 10

2.1.1.4 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) .................... 12

2.1.1.5 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික. සහයෝගිතාවය සඳහා වූ බහුපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම (BMSTEC) .................... 13

2.1.1.6 යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම .................... 15

2.1.1.7 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වූ විදේශ වෙළඳාම .................... 16

2.2 ඒකාබද්ධ ආර්ථික ගිවිසුම් .................... 17

2.3 ආනයනික තීරුබදු ව්‍යුහය .................... 18

2.3.1 2015 වර්ෂයේදී සංයෝජිත කේත අංක ක්‍රමයට අළුතින් එකතු කරන ලද ජාතික උප බෙදීම් .................... 18

2.3.2 ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුමට (SAFTA) අදාල තිරුබදු ව්‍යුහය - 2015 .................... 18

2.3.3 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ සිදු කරන ලද සංශෝධන .................... 18

2.4 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත .................... 18

2.5 තීරුබදු කපා හැරීම්........................................................................................ 19

2.6 ආයෝජන........................................................................................ 20

2.6.1 විදේශ සෘජු ආයෝජන (FDI)........................................................................ 20

2.6.2 විදේශ රටවල කරනු ලබන ආයෝජන (බාහිර විදේශීය ආයෝජන).................... 21

2.7 ජාත්‍යන්තර සහයෝගිතාවය........................................................................ 22

2.7.1 සාක් (SAARC) සංවර්ධන අරමුදල (SDF)................................................ 22

2.8 බන්ධිත භාණ්ඩ........................................................................................ 23

**3. පරිපාලන හා මූල්‍ය කාර්ය සාධනය**........................................................................ 24

3.1 පරිපාලන අංශය........................................................................................ 24

3.2 විශේෂ ව්‍යාපෘති යෝජනා ක්‍රම........................................................................ 28

3.2.1 සහන කොන්දේසි යටතේ රාජ්‍ය සේවකයන් සඳහා වාහන ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය........................................................................ 28

3.2.2 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ජ්‍යේෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායි මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම........................................................................ 28

3.3 මූල්‍ය අංශය........................................................................................ 28

3.4 විගණන විමසුම්........................................................................................ 29

**4. ඇමුණුම්**........................................................................................ 30

වගු


| | | |
|---|---|---|
| වගුව 2.1 | ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන ප්‍රමාණයන් -2014 / 2015 | 09 |
| වගුව 2.2 | පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද මුළු ආනයන හා අපනයන ප්‍රමාණයන් - 2014 / 2015 | 10 |
| වගුව 2.3 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහන | 11 |
| වගුව 2.4 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද මුළු ආනයන හා අපනයන ප්‍රමාණයන් - 2014 / 2015 | 11 |
| වගුව 2.5 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන ප්‍රමාණයන් -2014 / 2015 | 13 |
| වගුව 2.6 | බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC) සඳහා බදු ලිහිල්කිරීම් කරන උපලේඛනය | 13 |
| වගුව 2.7 | ගිවිසුම්ගත විගස තීරුබදු ලිහිල්කිරීම | 14 |
| වගුව 2.8 | සාමාන්‍ය බදු ලිහිල්කරණ ක්‍රමවේදය | 15 |
| වගුව 2.9 | 2015 වර්ෂයේදී වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව විසින් කරන ලද ආයෝජන | 16 |
| වගුව 2.10 | ඒකාබද්ධ ආර්ථික වෙළඳ කමිටුවේ සාරාංශය | 16 |
| වගුව 2.11 | 2015 දෙසැම්බර් 31 දිනට තීරුබදු ව්‍යුහය | 17 |
| වගුව 2.12 | 2008 සිට 2015 දක්වා තීරුබදු ව්‍යුහය තුළ සිදුකරන ලද වෙනස්කම් | 18 |
| වගුව 2.13 | 2015 වර්ෂයේදී රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය යටතේ ලබාදී ඇති තීරුබදු සහන | 19 |
| වගුව 2.14 | රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය යටතේ පොදු තීරුබදු කපා හැරීම් | 20 |
| වගුව 2.15 | ආයෝජන මණ්ඩල නිශේධන ලැයිස්තුව යටතේ ආයෝජන මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීම් | 20 |
| වගුව 2.16 | 2015 වර්ෂයේදී අනුමත කරන ලද විදේශ ආයෝජන | 21 |
| වගුව 2.17 | 2015 වර්ෂයේදී පවත්වන ලද සාක් සංවර්ධන අරමුදලේ රැස්වීම් | 22 |
| වගුව 3.1 | 2015.12.31.දිනට අනුමත කාර්ය මණ්ඩලය | 24 |
| වගුව 3.2 | පුහුණු පාඨමාලා/ අධ්‍යන චාරිකා /විදේශ සම්මන්ත්‍රණ 2015 | 25 |
| වගුව 3.3 | 2015 දේශීය පුහුණු පාඨමාලා /අධ්‍යන චාරිකා/සම්මන්ත්‍රණ/වැඩමුළු/විදේශීය රැස්වීම් | 27 |
| වගුව 3.4 | 2015 වර්ෂය තුළදී අයවැය ඇස්තමේන්තු උපයෝජනය | 29 |
| වගුව 3.5 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම 2015 | 29 |
| වගුව 4.1 | සංයෝජිත වර්ගීකරණ සඳහා ජාතික උප බෙදුම් - 2015 | 30 |
| වගුව 4.2 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම් (SAFTA) යටතේ තීරුබදු නිදහස් කිරීම් - 2015 | 32 |
| වගුව 4.3 | 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත (රේගු ආනයන තීරුබදු) | 33 |
| වගුව 4.4 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන සංශෝධන | 34 |
| වගුව 4.5 | විගණන විමසුම් – රජයේ විගණන 2015 | 35 |
| වගුව 4.6 | විගණන විමසුම් – කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව 2015 | 36 |

# 1. හැඳින්වීම

## 1.1 සංවිධාන රාමුව

රටේ ජාත්‍යන්තර ආර්ථික ඒකාබද්ධකරණය ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීමේ පුළුල් පරමාර්ථයෙන් 2006 වර්ෂයේ ජුනි මාසයේදී මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කර මුදල් අමාත්‍යාංශයේ මහ භාණ්ඩාගාරය යටතේ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදි.

ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ ජනතාවගේ යහසාධනය උදෙසා විදේශ වෙළඳාම, තීරුබදු සහ ආයෝජන සම්බන්ධයෙන් තිරසාර ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් පුළුල් කිරීම සඳහා "වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වශයෙන්" 2012 වර්ෂයේදී නැවතත් නම වෙනස් කරන ලදි.

වර්ෂ 2015 දී වඩා ඵලදායි සේවාවක් ලබා දීම උදෙසා දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික දිශානතිය ප්‍රතිව්‍යුහගත කර එහි දැක්ම, මෙහෙවර, අරමුණු හා අභිමතාර්ථ මෙන්ම ආයතනික ව්‍යුහයද විධිමත්ව සකස් කරන ලදි.

දෙපාර්තමේන්තුව විසින් ස්වකීය ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පරිදි අංශ තුනක් ස්ථාපනය කරන ලදි.

1. වෙළඳ ප්‍රතිපත්ති අංශය
2. ආයෝජන ප්‍රතිපත්ති අංශය
3. පරිපාලන හා විශේෂ ව්‍යාපෘති අංශය

## 1.2 දැක්ම

රටේ සමස්ත සංවර්ධනය උදෙසා වෙළඳාම හා ආයෝජනය තුළ ප්‍රගතිගාමී ප්‍රතිපත්ති ව්‍යාප්ත කිරීම සුරක්ෂිත කිරීම

## 1.3 මෙහෙවර

සමස්ථ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර ආර්ථික වෙළඳ පද්ධතියට පහසුකම් සැලසීම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති සම්පාදනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.


## 1.4 අරමුණු

- කලාපය තුළ ඍජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම
- ව්‍යාපාර පහසු කිරීම් දර්ශකය අනුව ශ්‍රී ලංකාව පලමු රටවල් 50 අතරට ගෙන ඒම
- කර්මාන්ත හිතකාමී තීරු බදු ක්‍රමවේදයක් ඇති කිරීම
- වර්ෂ 2020 වනවිට ඇමරිකානු ඩොලර් බිලියන 25 ක් වෙළඳ ආර්ථිකයක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- රාජ්‍ය අංශයේ සේවකයන්ට සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරීම
- තරඟකාරී වාසියක් ලැබෙන පරිදි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම

## 1.5 අභිමතාර්ථ

- ඉදිරි වර්ෂ දෙක තුළදී ආයෝජන බලය පැවරීමේ පවතින ප්‍රතිපත්ති සරල කිරීම
- ආයෝජන අධෛර්යමත් කිරිමට ඇති බාධක ඉදිරි ඊළඟ වර්ෂ දෙක තුළ ඉවත් කිරීම
- අපනයන සැකසුම් යෝජනා ක්‍රම සඳහා තාවකාලික ආනයනය කිරීම් හා බන්ධිත ගුදම් ප්‍රතිපත්ති ඉදිරි වර්ෂ තුන තුලදී ශක්තිමත් කිරීම
- වසරක් තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශය සඳහා ප්‍රතිපත්තියක් සැකසීමට අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා සංවිධානය කිරීම
- ඉදිරි වර්ෂ දෙක තුළ කුඩා පරිමාණ ව්‍යවසායකයන් මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් දක්වාත් මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් මහාපරිමාණය දක්වා උසස් කිරීමට යාන්ත්‍රණයක් හඳුන්වා දීම
- 2018 වර්ෂය වනවිට චීනය,ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය හවුල සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම
- ඉදිරි වර්ෂ දෙක තුලදී සේවාදායක හිතකාමී දත්ත පද්ධතියක් හරහා අවශ්‍ය තොරතුරු සපයමින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම
- බාහිර ආයෝජකයන් සඳහා නෛතික මාර්ගෝපදේශයක් සකස් කිරීම
- වසරක් තුළ රාජ්‍ය නිලධාරීන්හට සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම
- 2017 වර්ෂය වනවිට භාණ්ඩ හුවමාරු වෙළඳාම ඇමරිකානු ඩොලර් බිලියන 15 කින් ඉහළ නැංවීම
- ඉදිරි වර්ෂ දෙක තුළදී තීරුබදු වලට අදාළ ගැටළු 10% ට වඩා අවම කිරීම
- රටේ වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පදනම් කරගෙන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම
- ගෝලීය වාසිසහගත වෙළඳාම/කර්මාන්ත වලට ප්‍රවේශවීමට ඉඩ සලසන්නාවූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම

1.6 සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජ්‍යෙෂ්ඨ උපදේශක
අධ්‍යක්ෂ (වෙළඳ)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (ආයෝජන)
ස.අ - I (වෙළඳ)
ස.අ- II (වෙළඳ)
ස.අ-III (වෙළඳ)
ස.අ (සැලසුම්)
ස.අ (පාලන)
ස.අ(විශේෂ ව්‍යාපෘති)
ස.අ (මුදල්)
ස.අ. (ආයෝජන)
ස.අ (ආයෝජන)
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 2
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 1
ප්‍ර.ක.ස
ප.ස/සං.නි 2
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 2
ක.සහකාර 1
ක.සහකාර 1
ක.සහකාර 2
ක.සහකාර 1
ක.ස/පෞ. ස 6
ක.සහකාර 2
ක.සහකාර 3
ක.සහකාර 1
ක.සහකාර 2
රියදුරු - 5
කාර්යාල සහායක සේවය -8

## 1.7 කාර්යයන්

### 1.7.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය

ප්‍රතිපත්ති සම්පාදනය,ක්‍රියාත්මක කිරීම මෙන්ම වෙළඳ තීරුබදු හා නිදහස් වෙළඳ ගිවිසුම් වලට අදාළ කරුණු පිළිබඳ සමාලෝචනය කිරීමේ වගකීම දරනු ලබන්නේ වෙළඳ ප්‍රතිපත්ති අංශය විසිනි.මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

#### 1.7.1.1 වෙළඳ ප්‍රතිපත්ති

i. සවිස්තරාත්මක වෙළඳ ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරිම
ii. ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති වලට අදාළ නීති සම්පාදනය කිරීම
iii. ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති වලට අදාළ රෙගුලාසි සම්පාදනය කිරිම
iv. වෙළඳ ප්‍රතිපත්ති වලට අදාළ ගැටලු හා විකල්ප විශ්ලේෂණය කිරිම
v. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත බලාත්මක කිරිම
vi. වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය කිරිම හා යාවත්කාලීන කිරිම
vii. මෝටර් රථ ආනයන ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීම
viii. වෙළඳ/ව්‍යාපාර සංසඳ සංවිධානය කිරිම
ix. වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධ පාර්ශව අතර කතිකාවන් ඇතිකිරීම
x. වෙළඳ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත්කිරිම
xi. වෙළඳාමට අදාළ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම
xii. පාර්ශවකරුවන් ඉදිරිපත් කරනු ලබන වෙළඳ ප්‍රතිපත්ති වලට අදාළ ගැටළු විසඳීම
xiii. වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශන සකස් කිරීම
xiv. වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම
xv. වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ පාර්ලිමේන්තු කටයුතු
xvi. වෙළඳ ප්‍රතිපත්තිවලට අදාළ අධිකරණ නඩු වලට පිළිතුරු සම්පාදනය කිරීම
xvii. අමාත්‍ය මණ්ඩල සංදේශ/නිරීක්ෂණ/ සටහන් සකස් කිරිම

#### 1.7.1.2 නිදහස් වෙළඳ ගිවිසුම්

i. ශ්‍රී ලංකාව සඳහා පොදු නිෂේධන/සංවේදී ලැයිස්තුවක් සකස් කිරීම ( සියලුම නිදහස් වෙළඳ ගිවිසුම් ආවරණය වන පරිදි)
ii. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ එකඟතාවයන් සහ බැඳීම් පිළිබඳ මාර්ගොපදේශයක් සකස් කිරීම
iii. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ තීරුබදු ලිහිල්කරන සැලසුම සකස් කිරීම

iv. නිදහස් වෙළඳ ගිවිසුම්වල සඳහන් ස්ථාවර කමිටු සම්බන්ධීකරණය කිරීම (SCFTA)
v. ආර්ථික කළමනාකරණය පිළිබඳ සම්බන්ධීකරණය කිරීමේ කමිටුව සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාළ කරුණු සම්බන්ධීකරණය කිරීම
vi. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට සමාන්තරව වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම
vii. පහත සඳහන් ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- නිදහස් වෙළඳ ගිවිසුම් සංවාද පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය (SFTA සහ US – SL:FTA, ETCA)
- ඒකාබද්ධ වෙළඳ කමිටු සම්බන්ධීකරණය (කෙන්යාව, වියට්නාමය, ජපානය, රුසියාව ආදිය)

**1.7.1.3 තීරුබදු ප්‍රතිපත්ති**

i. තීරුබදු මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රතිශෝධනය කර යාවත්කාලීන කිරීම (පරිච්ඡේද වශයෙන්)
ii. තීරුබදු සමාලෝචනය සඳහා වෙළඳපොල තත්වයන් කර්මාන්ත ආශ්‍රිතව සංසන්දනය කිරීම
iii. තීරුබදු විෂමතා ඉවත්කිරීම සඳහා කර්මාන්ත (අගය එකතු කිරීම) සහ වෙළඳපොල විශ්ලේෂණය කිරීම
iv. 19(ආ) වගන්තිය යටතේ තීරුබදු ඉවත් කිරීම් සම්බන්ධීකරණය කිරීම
v. 19(ආ) වගන්තිය යටතේ තීරුබදු ඉවත් කිරීම සඳහා තොරතුරු පද්ධතියක් සකස් කිරීම
vi. රේගු ආඥා පනත යටතේ රෙගුලාසි සම්පාදනය සඳහා පහසුකම් සැලසීම
vii. ආදායම් සංරක්ෂණ ආඥාව ප්‍රකාශයට පත් කිරීම (RPO)
viii. තීරුබදු විෂමතා වලට අදාල දුක් ගැනවිලි වලට විසඳුම් ලබාදීම
ix. සංයෝජිත වර්ගීකරණය ජාතික උප බෙදීම් කළමනාකරණය
x. තක්සේරු කිරීම් ඇතුළුව රේගු නඩු පිළිබඳ අභියාචන සමාලෝචනය කිරීම
xi. රේගු පරිපාලනය පිළිබඳ විගණන වාර්තා සමාලෝචනය කිරීම
xii. සංයෝජිත වර්ගීකරණ කේත අංක වලට අනුකූලවීම සහ අන්‍යෝන්‍ය ස්ථාපනය

xiii. විශේෂ වෙළඳ භාණ්ඩ පනත ක්‍රියාත්මක කිරීම
xiv. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම
xv. බන්ධිත ගුදම් පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම
xvi. අයවැය යෝජනා සකස් කිරීම
xvii. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

**1.7.1.4. පොදු (වෙළඳාම හා ආයෝජන ප්‍රතිපත්ති විෂයන් අතර පැතිකඩක්)**

i. මෝටර් වාහන එකලස් කිරීමේ කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම
ii. ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යටතේ ආනයන නිශේධ ලැයිස්තු සමාලෝචනය කිරීම
iii. වෙළඳ ප්‍රතිපත්ති වලට අදාල අයවැය යෝජනා

## 1.7.2 ආයෝජන ප්‍රතිපත්ති අංශය

රාජ්‍ය ආයතනවල ආයෝජන සම්බන්ධ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධ වගකීම ආයෝජන ප්‍රතිපත්ති අංශයට අදාල වේ. මෙම අංශයට පවරා ඇති ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

i. විදේශීය හා දේශීය ආයෝජන පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
ii. අදාළ පාර්ශවකරුවන් සමග විදේශ ආයෝජන ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම
iii. විදේශ ආයෝජන සම්බන්ධයෙන් නෛතික කරුණු පිළිබඳ සොයා බැලීම
iv. මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් විනිමය පාලන පනත යටතේ අභියාචනා සැලකිල්ලට ගැනීම
v. බැංකු ශාඛා සහ  ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්ථාපිත කිරීම, ස්ථානගත කිරීම සහ අවසන් කිරීම  සඳහා අනුමැතිය ලබාදීම
vi. ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සඳහා අනුමැතිය ලබාදීම
vii. විනිමය පාලන පනත, බැංකුකරණ පනත සහ මූල්‍ය නීති පනත සම්බන්ධයෙන් සියළුම අනුමැතීන් ලබාදීම
viii. මූල්‍ය ගනුදෙණු වාර්තා  කිරීමේ පනත, මුදල් විශුද්ධි කිරීම වැලැක්වීමේ පනත සහ ත්‍රස්තවාදී
මූල්‍ය වැලැක්වීමේ පනත පිළිබඳ සම්මුතිය සම්බන්ධයෙන් සියලුම අනුමැතීන් ලබාදීම
ix. බන්ධිත ගුදම් සඳහා අනුමැතිය
x. බන්ධිත ගුදම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
xi. අදාළ පාර්ශවකරුවන් සමග බන්ධිත ගුදම් ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම
xii. අදාල පාර්ශවකරුවන් සමග දේශීය හා  ආයෝජන ප්‍රතිපත්ති රාමුවක් වැඩිදියුණු කිරීම
xiii. ආයෝජන මණ්ඩල පනතට අදාළ කාරණා පිළිබඳ සොයා බැලීම

xiv. උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනතට අදාළ කාරණා සොයා බැලීම

xv. ආයෝජන මණ්ඩලයේ නිෂේධන ලැයිස්තුවේ අයිතමයන් පිළිබඳ එකඟතාවය ලබාදීම

xvi. වර්ථමාන ආයෝජන මණ්ඩල නිෂේධන ලැයිස්තුව සමාලෝචනය කිරීම සහ පරතරය විශ්ලේෂණය කිරීම

xvii. අපනයන සැකසුම් සඳහා තවකාලික ආනයන යෝජනා ක්‍රමයට අදාළ කරුණු පිළිබඳව සොයා බැලීම

xviii. අපනයන සැකසුම් සඳහා තවකාලික ආනයන යෝජනා ක්‍රමය සඳහා නව ප්‍රතිපත්ති රාමුවක්

සමාලෝචනය කර සංවර්ධනය ඇති කිරීමට සහයෝගය දැක්වීම

xix. පෞද්ගලික රාජ්‍ය බද්ධ ව්‍යාපාර වලට අදාල කරුණු පිළිබඳ සොයා බැලීම

xx. මූල්‍ය පනතට (කේන්ද්‍රීය රෙගුලාසි) අදාල කරුණු සොයා බැලීම

xxi. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සඳහා සහයෝගය දැක්විම

xxii. දේශීය ආයෝජනය සඳහා ආයෝජන හැකියාවන් සොයා බැලීම

xxiii. භූමිය පදනම් කරගත් ආයෝජන සිතියම් ගතකිරීම වැඩි දියුණු කිරීම

xxiv. සාර්ක් සංවර්ධන අරමුදලට අදාළ සියළුම කටයුතු පිළිබඳ සොයා බැලීම

xxv. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලයට අදාළ සියළුම කටයුතු සොයා බැලීම

xxvi. අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

xxvii. ආයෝජනයට අදාළ අයවැය යෝජනා සකස් කිරීම

xxviii. අමාත්‍ය මණ්ඩල සංදේශ - නිරීක්ෂණ සහ සටහන් සකස් කිරීම

### 1.7.3 පරිපාලන හා මූල්‍ය අංශය

මානව සම්පත්, මූල්‍ය හා වත්කම් කළමනාකරණය පහත සඳහන් ආකාරයට පරිපාලන හා මූල්‍ය කටයුතු අංශය යටතේ පාලනය වේ.

i. අවසන් ගිණුම් සහ කාර්ය මණ්ඩල අත්තිකාරම් ගිණුම් පිළියෙල කිරීම මගින් ශක්‍යතා වර්ධන මූල්‍ය කළමනාකරණය ඇතුලු මානව සම්පත් කළමනාකරණය

ii. අත්පත් කර ගැනීම හා වත්කම් ලේඛනය පවත්වා ගෙන යාම (භෞතික සම්පත් කළමනාකරණය)

iii. භාණ්ඩ සමීක්ෂණය, ලේඛන කළමනාකරණය යනාදිය ඇතුළු විගණන නිරීක්ෂණ හා රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශනයට අනුකූලව කටයුතු කිරීම.

#### 1.7.3.1 මානව සම්පත් පැතිකඩ

2015 වර්ෂය අවසන් වන විට දෙපාර්තමේන්තුව මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකු හා සහායක කාර්ය මණ්ඩලය 42 දෙනෙකුගෙන් සමන්විත විය. අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් සැඳුම්ලත් දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ, අධ්‍යක්ෂවරයෙකු හා

නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. 2015 වසරේදී දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 57 ක් වන අතර, එය මාණ්ඩලික නිලධාරීන් 14 කින් හා සහායක කාර්ය මණ්ඩලය 43 කින් සමන්විත වේ. (විස්තර 3.1 වගුවේ දැක්වේ)

## 2. ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

### 2.1 වෙළඳ ගිවිසුම්

දේශීය කර්මාන්තයන්හි සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට හා ශ්‍රී ලංකාව දැනුමේ හා වෙළඳාමේ සන්ධිස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම හා ආයෝජන ද ආවරණය වන ආකාරයේ වූ ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය වෙළඳ ගිවිසුම් මගින් තවදුරටත් ලෝක ආර්ථිකය හා ඒකාබද්ධ වීමට 2015 වර්ෂයේ ද ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්තියෙහි අවධානය යොමු විය.

ලෝක වෙළඳ සංවිධානයේ ඇති ගිවිසුම් ප්‍රකාරව නිදහස් වෙළඳාම සඳහා වූ තාක්ෂණික බාධක, සත්ව හා ශාක වෙළඳාම සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග හා වෙළඳ හා සංවර්ධන අංශයන් පිළිබඳ පවත්වන ලද කමිටු සඳහා ශ්‍රී ලංකාව අඛණ්ඩව සහභාගි විය. කෘෂිකර්මාන්තය, කෘෂි නොවන භාණ්ඩ සඳහා වෙළඳපොළ ප්‍රවේශය, සේවා, වෙළඳ පහසුකම්, රීති සහ 2008 දෙසැම්බර් මස නිකුත් කළ කෙටුම්පත් න්‍යාය පත්‍රයේ ආදර්ශ යෝජනා මත පදනම් වූ ප්‍රභවස්ථාන රීති ආදී ප්‍රමුඛ ක්ෂේත්‍රයන් ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ ගනුදෙනු සංවර්ධන න්‍යාය පත්‍රයේ ඇතුළත් විය. ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ නීති රීති හා ගැටීමෙන් තොරව සාර්ථකව කටයුතු කිරීමට සමත්ව ඇත.

මෙම දෙපාර්තමේන්තුව ද්විපාර්ශවීය හා කලාපීය වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හා ඵලදායි සාකච්ඡාවන් පැවැත්වීම මගින් විදේශ වෙළඳාමෙහි උපරිම වාසි රටට අත්පත් කර දීමේ ක්‍රියාවලියේ තවදුරටත් නිරතව සිටී. දැනට ක්‍රියාත්මක කරනු ලබන කලාපීය, ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය වෙළඳ ගිවිසුම් පහත දක්වා ඇත.

- ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම - නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC)

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් තුළින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු වනුයේ, ඉහළ ඒක පුද්ගල ආදායමක් ළඟාකර ගැනීම, සංචාරක පාරාදීසයක් කිරීම හා විභවයන් ඇති දේශීය කර්මාන්තයන් ආරක්ෂා කරමින් හා ඒවා සංවර්ධනය කරමින් තරඟකාරී වෙළඳ පරිසරයක් තුළ දැනුමේ හා වෙළඳාමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමයි. කෘෂි හා කර්මාන්ත ක්ෂේත්‍රවල ශ්‍රම හිඟය ඉදිරියේ සේවා වෙළඳාම සංවේදී ක්ෂේත්‍රයක් වී ඇත. ඒ අනුව, විස්තීර්ණ ආර්ථික සහයෝගිතාවයක් සඳහා වන

රාමුවක් තුළ සේවා අංශයේ ගනුදෙනු සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කර දෙමින් සුදුසු ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත.

### 2.1.1 වෙළඳ ගිවිසුම් යටතේ අත්කරගෙන ඇති ප්‍රගතිය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුවේ එකඟතාවය පරිදි වෙළඳ ගිවිසුම්වල ඇතුලත් තීරුබදු සංශෝධන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. ඒ අනුව, වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු පහත දක්වා ඇත.

#### 2.1.1.1. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

2013 ශ්‍රී ලංකාව සිය නිශේධන ලැයිස්තුවෙන් අයිතම 10 ක් ඉවත් කිරීමෙන් අනතුරුව 2015 වසරේදී නිෂේධන ලැයිස්තුවේ නව සංශෝධනයන් තව දුරටත් සිදු නොවීය.

**වගුව 2.1- ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2014 / 2015**

| 2014 | | 2015 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) |
| 68,856 | 49,126 | 32,676 | 60,539 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව 2014/2015*

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර මුළු වෙළඳාම රුපියල් බිලියන 606.8 සිට රුපියල් බිලියන 674.3 දක්වා ඉහල ගොස් ඇත. 2015 වර්ෂයේදී ඉන්දියාවෙන් කරන ලද මුළු ආනයන ප්‍රමාණය රුපියල් බිලියන 566.5 ක් වන අතර ඉන්දියාවට කරන ලද මුළු අපනයන ප්‍රමාණය රුපියල් බිලියන 107.8 ක් වේ.

පිළිවෙලින් 2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේදී ඉන්දියාවෙන් කරන ලද ආනයන රුපියල් මිලියන 68,856 සිට රුපියල් මිලියන 32,678 දක්වා අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය වසරට සාපේක්ෂව 2015 වර්ෂයේදී ඉන්දියා ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම යටතේ වූ වෙළඳාම ආසන්න වශයෙන් රුපියල් බිලියන 25 කින් පහත වැටී ඇත. කෙසේ වුවද ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවට කරන ලද අපනයන 2014 වර්ෂයේදී රුපියල් මිලියන 49,126 ට සාපේක්ෂව 2015 වර්ෂයේදී රුපියල් මිලියන 60,539 ක සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය වගුව 2.1 මගින් දක්වා ඇත.

#### 2.1.1.2. පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

පාකිස්තාන් ගරු වෙළඳ අමාත්‍යවරයාගේ සංචාරයට සමාන්තරව 2015නොවැම්බර් මස 11 දින පාකිස්තාන් ශ්‍රී ලංකා ද්විපාර්ශවීය සාකච්ඡා පවත්වන ලදී. මෙම රැස්වීමේදී ද්විපාර්ශ්වීය වෙළඳාමට අදාළ පවත්නා ගැටළු දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලදි.

පාකිස්තානය විසින් ඒකපාර්ශිකව නිෂේධ ලැයිස්තුවට සමහර අයිතමයන් ඇතුලත් කිරීමෙන් නිදහස් වෙළඳ ගිවිසුමේ අසමතුලිතතාවයක් නිර්මාණය වී ඇති බව ශ්‍රී ලංකාව විසින් සඳහන් කරන ලදි. නිදහස් වෙළඳ ගිවිසුමේ දෙවන අදියරේදී නව අයිතමයන් සහිත නිදහස් අයිතම ලැයිස්තුවක් හුවමාරු වීම තුලින් මෙම ගැටළුව විසඳෙන බවට පාකිස්තානය විසින් සඳහන් කරන ලදි. පකිස්තානය සඳහා ලබාදී ඇති කෝටා ක්‍රමය යටතේ ගුණාත්මකභාවයෙන් අඩු බාස්මති සහල් ආනයනය කරනු ලබන බවත්, ඉදල් ඉරිගු මත අපනයනයේදී පනවා ඇති 5% ක් වූ බද්ද ඉවත් කරන ලෙසත්, ආනයනික භාණ්ඩ සඳහා වෙනම වෙළඳ මිලක් පැනවීම මගින් ශ්‍රී ලංකාවට අසාධාරණයක් සිදුව ඇති බවත් ශ්‍රී ලංකාව දන්වන ලදි.

වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා ආයෝජන, සේවා සහ රේගු කටයුතු ඇතුලත් කරමින් නිදහස් වෙළඳ ගිවිසුම පුළුල් කිරීමටත්, පාකිස්තාන් වෙළඳ සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටත් පාකිස්තානය යෝජනා කර ඇත. රටවල් දෙක අතර වෙළඳ ආරවුල් නිරාකරණය කර ගැනීමට යාන්ත්‍රණයක් සකස් කිරීමටද පාකිස්තානය විසින් යෝජනා කරන ලදි. පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පකිස්තානයෙන් ආනයනය කරනු ලබන වානේ කම්බි සඳහා තීරුබදු ඉවත් කර ඇති නමුත් ඒ සඳහා පනවා ඇති සෙස් බදු මගින් බදු නොවන වෙළඳ බාධක ශ්‍රී ලංකාව විසින් යොදා ඇති බව පකිස්තානය දන්වා ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාව හා පාකිස්තානය අතර අග්‍රාමාත්‍යවරුන්ගේ හමුවට ප්‍රථම මෙම සියලු ගැටළු සලකා බැලීමට දෙපාර්ශවය එකඟ විය.

(පාකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන 2.2 වගුව මගින් පෙන්නුම් කෙරේ.)

**වගුව 2.2 පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2014 / 2015**

| 2014 | | 2015 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) |
| 9,577 | 6,761 | 4,026 | 9,147 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2014/2015*

### 2.1.1.3.දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 2004 වසරේදී පකිස්තානයේ ඉස්ලාමාබාද්හි පැවති 12 වැනි සාර්ක් සමුළුවේදී අත්සන් තබන ලදුව, 2006 වසරේ ජනවාරි 01 වන දින දී ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව දැනට මෙහි සාමාජික රටවල් වේ.

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙහි වෙළඳ ලිහිල්කරණ වැඩසටහන යටතේ නිෂේධන ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ හැර අනෙකුත් සියලුම භාණ්ඩ සඳහා වූ තීරුබදු 0 – 5% මට්ටම දක්වා ක්‍රමයෙන් අඩු කිරීමට සියලු සාමාජික රටවල් එකඟ වී ඇත.

වෙළඳ ලිහිල්කරණ වැඩසටහන යටතේ එකඟ වී ඇති පරිදි පළමු සහ දෙවැනි අදියර යටතේ සිදුකල යුතු තීරුබදු ලිහිල්කිරීම් 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් සිදුකර ඇත. ඌන සංවර්ධිත රටවල් (*LDC's*) හා සංවර්ධනය වෙමින් පවතින රටවල් (NL*DCS)* සඳහා ශ්‍රී ලංකාව විසින් පිරිනමනු ලබන නිෂේධන ලැයිස්තුව පහත පරිදි වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල් (*NLDC's)* සඳහා - අයිතම 1,058

ඌන සංවර්ධිත රටවල් (*LDC's* ) සඳහා -අයිතම 925

පහත සඳහන් උපලේඛනය පරිදි සාමාජික රටවල් විසින් 2012 ජනවාරි මාස 01 වන දින සිට නිෂේධන ලැයිස්තුවෙන් ඉවත්කර ගනු ලැබ ඇති භාණ්ඩ මත 0 – 5% දක්වා තීරුබදු අඩු කිරීම අවශ්‍යව ඇත.

**වගුව 2.3 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම අනුව, තීරුබදු ලිහිල් කරන වැඩසටහන**

| අනු පිළිවෙල | රටවල් | වසර ගණන | සම්පූර්ණ කිරීමට නියමිත දිනය | අඩු කරනු ලබන තීරුබදු ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1 | ඉන්දියාව, පාකිස්තානය | 03 | 015 දෙසැම්බර් 31 | 0 - 5% |
| 2 | ශ්‍රී ලංකාව | 06 | 2018 දෙසැම්බර් 31 | 0 - 5% |
| 3 | LDC's (නේපාලය හැර) | 08 | 2020 දෙසැම්බර් 31 | 0 - 5% |
| 4 | නේපාලය | 08 + | 2021 අගෝස්තු 01 | 0 - 5% |

*මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව , 2015*

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ 2015 වර්ෂයේ තීරුබදු ලිහිල් කරන වැඩ සටහනෙහි තුන්වන අදියර සඳහා වන පිරිනැමුම් ලැයිස්තුව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කර ඇත. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වෙළඳ දත්ත 2.4 වගුව මගින් පෙන්නුම් කෙරේ.

**වගුව 2.4 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන - 2014 / 2015**

| 2014 | | 2015 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) |
| 237 | 1,975 | 696 | 3,270 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2014/2015*

**2.1.1.4.ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)**

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටු 47 හා 48 වන සැසි වාර 2015 දී පවත්වන ලදි. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ 47 වන සැසිවාරය 2015 ජූලි මස 27- 28 දිනවලදී බැංකොක් නගරයේ පැවැත්වූ අතර 48 වන සැසිය 2015 දෙසැම්බර් මස 22-23 දිනවල බැංකොක් නගරයේ පවත්වන ලදි. 48 වන සැසියේදී පහත සඳහන් තීරණ ගන්නා ලදි.

**1.භාණ්ඩ වෙළඳාම**

I. 4 වන වටයේදී එකඟ වූ බදු සහන තවදුරටත් ප්‍රමාද නොකර ක්‍රියාත්මක කිරීමට සියලුම කමිටු සාමාජිකයින් එකඟ විය.

II. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ මුල් ලේඛනයට දෙවන සංශෝධනයක් ලෙස ඇතුලත් කිරීම සඳහා කොරියානු ජනරජය විසින් නිෂ්පාදනය කරන ලද බවට නිකුත් කරන ලද සහතිකයේ 8 වන කොටුව සඳහා වන යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.

**2. සේවා පිළිබඳ ගිවිසුම**

සේවා පිළිබඳ ක්‍රියාකාරී කමිටුවක් ස්ථාපිත කිරීමට අමාත්‍යවරුන්ගේ සභාවට නිර්දේශ කිරීමටත් ක්‍රියාකාරී සැලැස්මක් හා සේවා ලිහිල්කරණය සඳහා කාල වකවානු තීරණය කිරීමටත්, සහයෝගීතාව සඳහා වන ක්ෂේත්‍ර හඳුනාගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමටත් පලමු ක්‍රියාකාරී කමිටුවේදී සිදුකිරීමට එකඟ විය.

**3. ආයෝජන පිළිබඳ ගිවිසුම**

ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කිරීමට සභාවට නිර්දේශ කිරීමටත්, ඒ සඳහා ආකෘතියක්, ක්‍රියාකාරී සැලැස්මක් හා සේවා ගිවිසුම් පිළිබඳ කාලරාමුවක් පිළිබඳ සාකච්ඡා කිරීමටත් එකඟ විය.

**4. වෙළඳ පහසුකම් සැලසීම පිළිබඳ ගිවිසුම**

වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කිරීමට සභාවට නිර්දේශ කිරීමටත්, ඒ සඳහා වූ ආකෘතියක් සකස් කිරීම, ක්‍රියාකාරී සැලැස්ම හා ක්‍රියාකාරී වැඩසටහන සිදුකිරීම සඳහා කාල රාමුවක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමටත් එකඟ විය.

ඉහත දක්වා ඇති කරුණු වලට අමතරව විශේෂයෙන් ශාන්තිකර කලාපයේ රටවල් ආවරණය කරමින් ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ සාමාජිකත්වය පුළුල් කිරීමට සූදානම් වන බව ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ ලේකම් කාර්යාලය විසින් දැනුම්දී ඇති අතර වෙළඳම කෙරෙහි ඇතිවන ධනාත්මක බලපෑම සැලකිල්ලට ගනිමින් මෙම පුළුල් කිරීම සඳහා කමිටුව එකඟ වී ඇත.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව උදෙසා වන වෙළඳ කටයුතු 2.5 වගුවෙන් දැක්වේ.

**වගුව 2.5 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2014 / 2015**

| 2014 | | 2015 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු.මි.) | වටිනාකම (රු.මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු.මි.) |
| 1,673 | 15,666 | 2,103 | 17,522 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2014/2015*

**2.1.1.5.බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC)**

ගෝලීයකරණය හා කලාපීය සහයෝගිතාවය තවදුරටත් ආර්ථිකය අතර එක්කිරීම් හා අන්තර් බැඳීම් ඉහල දැමීම සිදුකර ඇත.

ගෝලීයකරණය සහ කලාපීය සහයෝගීතාවය හේතුවෙන් බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුමෙහි සාමාජිකයින් වන බංගලාදේශ මහජන සමූහාණ්ඩුව, භූතාන රාජධානිය, ඉන්දීය ජනරජය, මියන්මාරය, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය, තායිලන්ත රාජධානිය සහ නේපාලය යන රටවල කලාපීය සහයෝගීතාවය ශක්තිමත් කිරීමත් නව අභියෝගයන්ට මුහුණදීමේ හැකියාව විශාල ලෙස වැඩි දියුණු කිරිමේ අවස්ථාව උදා කිරීමත් මෙම ගිවිසුමෙහි විෂය පථය වශයෙන් සලකා 1997 වර්ෂයේදී බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාවය සඳහා වූ බහුපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම (BMSTEC) ආරම්භ කරන ලදි.

වගුව 2.6 සහ 2.7 මගින් බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාවය සඳහා වූ බහුපාර්ශවීය නිදහස් වෙළඳ ලිවිසුමෙහි බදු ලිහිල් කිරීමේ යෝජිත ක්‍රමවේදය.

**වගුව 2.6 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාවය සඳහා වූ බහුපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම සඳහා බදු නිදහස් කරන උපලේඛනය**

| අනු පිළිවෙල | ආකෘතිය / ක්‍රමවේදය | තීරුබදු සංකේතාංක ප්‍රතිශතය (සංයෝජිත වර්ගීකරණය 2007 - ඉලක්කම් 6) |
|---|---|---|
| 1 | ගිවිසුම්ගත වූ විගස බදු ඉවත් කිරීම | 10% |
| 2 | සාමාන්‍ය පරිදි බදු ඉවත් කිරීම | 48% |
| 3 | සාමාන්‍ය පරිදි බදු අඩු කිරීම | 19% |
| 4 | සංවේදී ලැයිස්තුව | 23% |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,2015*

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාවය සඳහා වූ බහුපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුමෙහි (BMSTEC) වෙළඳ සාකච්ඡා කමිටුවේ 20 වන රැස්වීම 2015 සැප්තැම්බර් 7 දින සිට 9 වන දින දක්වා තායිලන්තයේදී පවත්වන ලදි. එහිදී සාමාජික රටවල් පහත සඳහන් ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කරන ලදී.

01. භාණ්ඩ වෙළඳාම සම්බන්ධ කෙටුම්පත් ගිවිසුමෙහි ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සහ බිම්ස්ටෙක් නිදහස් වෙළඳ කලාපය සඳහා වූ නිදහස් වෙළඳ ගිවිසුම් මූලික ලියවිල්ල සංශෝධනය කිරීම.

02. භාණ්ඩ වෙළඳාම සම්බන්ධ එකඟතාවයන් ක්‍රියාත්මක කරනු ලබන දිනය තීරණය කිරීම.

03. සාමාන්‍ය පරිදි බදු අඩු කිරීම සහ සංවේදී ලැයිස්තුවේ ලැයිස්තුගත කර ඇති භාණ්ඩ ලැයිස්තු සමාලෝචනය කිරීම සඳහා ආකෘතියක් පිළිබඳ සාකච්ඡා කිරීම

බිම්ස්ටෙක් වෙළඳ සාකච්ඡා කමිටුවේ 20 වෙනි රැස්වීමේදී ගන්නා ලද තීරණ පහත පරිදි වේ.

01. වෙළඳ සාකච්ඡා කමිටු රැස්වීමේ අවසන් දින සිට නිදහස් කළහැකි අයිතම ලැයිස්තුව සමාලෝචනය කිරීම සඳහා මාසයක කාලයක් වෙන් කිරීම.

02. පහත සඳහන් වගුවේ දක්වා ඇති පරිදි වෙළඳාම් ලිහිල්කරණය ආරම්භ කිරීම සහ අවසන් කිරීම සඳහා ලබාදී ඇති කාලසීමාව එක් අවුරුද්දකින් දීර්ඝ කිරීමට නේපාලයට ඉඩ ලබාදී ඇති අතර එම සහනය නේපාලය විසින් 2016 වර්ෂයේ සිට ඉදිරියට ලබාගනු ඇත.

03. නිෂ්පාදන පිළිබඳ නිශ්චිත රීති (වටිනාකමේ අනුපාතය ඉහළ දැමීම) සමාලෝචනය කිරීමට ඉන්දියාවට අවශ්‍ය වූ අතර, ඒ සම්බන්ධ කෙටුම්පත සකස් කර බිම්ස්ටෙක් මහලේකම් කාර්යාලයට යැවීමට ඉන්දියාව එකඟ විය.

04. 2015 දෙසැම්බර් මාසය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමක් සංවිධානය කිරීමට බංගලාදේශය එකඟ වූ අතර, අවසන් ගිවිසුම අත්සන් කිරීම සඳහා අමාත්‍යවරුන්ගේ රැස්වීමක් ඉන් අනතුරුව පැවැත්වෙනු ඇත.

**වගුව 2.7 ගිවිසුම්ගත විගස තීරුබදු ලිහිල් කිරීම**

| අනු පිළිවෙල | රටවල් | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය | *බංගලාදේශය, භූතානය,මියන්මාරය සහ නේපාලය* |
|---|---|---|---|
| 1 | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය | *2016* ජූලි 1 සිට *2019* ජූනි 30 | *2016* ජූලි 1 සිට *2017* ජූනි 30 |
| 2 | *බංගලාදේශය, භූතානය, මියන්මාරය සහ නේපාලය* | *2012* ජූලි 1 සිට *2021* ජූනි 30 | *2012* ජූලි 1 සිට*2019* ජූනි 30 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

වගුව **2.8** සාමාන්‍ය පරිදි තීරුබදු ලිහිල් කිරීම

| අනු පිළිවෙල | රටවල් | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය | *බංගලාදේශය, භූතානය,මියන්මාරය සහ නේපාලය* |
|---|---|---|---|
| 1 | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය | 2017 ජූලි 1 සිට 2022 ජූනි 30 | 2017 ජූලි 1 සිට2020 ජූනි 30 |
| 2 | *බංගලාදේශය, භූතානය, මියන්මාරය සහ නේපාලය* | 2017ජූලි 1 සිට 2022 ජූනි 30 | 2017 ජූලි 1 සිට2025 ජූනි 30 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

**2.1.1.6 යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

චීනය 2012 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම ආනයනකරු මෙන්ම 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගෙන් තෙවැනි ස්ථානයට පත්වුවද, ශ්‍රී ලංකාවේ අපනයන සම්බන්ධයෙන් වැදගත් ස්ථානයක් චීනයට ලැබී නොමැත. වර්ෂ 2005-2014 දක්වා වූ දශකය තුළ චීනය ශ්‍රී ලංකාවේ විශාලතම ද්විපාර්ශික සංවර්ධන සහකරුවාද වී ඇත. දෙරට අතර දිගුකාලීන ද්විපාර්ශවීය සම්බන්ධය හා වෙළඳ ප්‍රවාහනයන් පුළුල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති (2013 මැයි මස) චීනයේ කරන ලද නිල සංචාරයේදී දැනට චීනයට වාසිසහගතව පවතින වෙළඳ ශේෂය, ශ්‍රී ලංකාවේ අපනයන ඉහල නැංවීම තුලින් මෙරටට වාසිදායක මට්ටමකට ගෙනඒම සඳහා චීනය හා ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුමක් සඳහා ඇති හැකියාව සොයා බැලීමට ඒකාබද්ධ ක්‍රියාකාරි වෙළඳ කමිටුවක් ඇතිකිරීම සඳහා චීනය හා ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදි. ඒ අනුව 2014 වර්ෂයේදී ඒකාබද්ධ ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කරන ලද අතර, එමඟින් චීනය හා ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුමක් සඳහා නිර්දේශ කර ඇත.

2014 වර්ෂය අවසන් වනවිට යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ දෙවන වටයේ ද්විපාර්ශවික සාකච්ඡාද අවසන් වී තිබුනි. චීන මහජන සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයාගේ ආරාධනාව මත 2015 මාර්තු මාසයේ අතිගරු ජනාධිපතිතුමාගේ චීන නිල සංචාරය තුළදී දෙරටේ ආර්ථිකය තුළ අසමානතා හඳුනා ගනිමින් නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සැබෑ ප්‍රගතියක් දැකීමට ශ්‍රී ලංකා රජය උනන්දුවන බව අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කරන ලදි.

2015 වර්ෂයේදී ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ශ්‍රී ලංකා රජය සහ චීනය අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ තුන්වන වටයේ සාකච්ඡා හැකි ඉක්මණින් නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**2.1.1.7 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ විදේශ වෙළඳාම**

ශ්‍රී ලංකාව සමඟ ඇතිකරගත් වෙළඳ ගිවිසුම් යටතේ සිදුකරන ලද භාණ්ඩ වෙළඳාම් පිළිබඳ විස්තර 2.9 වගුවේ දක්වා ඇත.

**වගුව 2.9 2015 වර්ෂයේ වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව විසින් කරන ලද ආනයන**

| අනු පිළිවෙල | වෙළඳ ගිවිසුම | ආනයන වටිනාකම (රු.මි.) | අපනයන වටිනාකම FOB (රු.මි.) |
|---|---|---|---|
| 1 | ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 32,676 | 60,539 |
| 2 | පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 4,026 | 9,147 |
| 3 | දකුණු ආසියානිදහස් වෙළඳ ගිවිසුම(SAFTA) | 696 | 3,270 |
| 4 | සාක්වරණීය වෙළඳ ගිවිසුම(SAPTA) | 95 | 703 |
| 5 | ආසියා පැසිපික් වෙළඳ ගිවිසුම (APTA) | 2,103 | 17,522 |
| **එකතුව** | | **39,596** | **91,181** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2015*

## 2.2 ඒකාබද්ධ ආර්ථික ගිවිසුම්

**වගුව 2.10 ඒකාබද්ධ ආර්ථික වෙළඳ කමිටුවල සාරාංශය**

| අනු පිළිවෙල | ඒකාබද්ධ වෙළඳ කමිටු | ලේඛණය | ලේඛනයේ දිනය | විෂයපථය | වාර ගණන | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා- ඉරාන<br>ආර්ථික සහයෝගිතාවය සඳහා ඒකාබද්ධ කොමිසම | වගන්ති 22 සහිත නිදහස් වෙළඳ ගිවිසුම | 2004.11.25 | භාණ්ඩ හුවමාරු වෙළඳාම | වාර්ෂික පදනම මත වෙනස්කිරීම | 2016.02.24 (කොළඹ) |
| 2. | ශ්‍රී ලංකාව හා මැලේසියාව අතර ආර්ථික, තාක්ෂණික හා විද්‍යාත්මක සහයෝගිතාවය පිළිබඳ ඒකාබද්ධ කොමිසම | එකඟවී ඇති වාර්තා | 2006.06.23 | වෙළඳ සහ ආයෝජන, සංචාරක, ගුවන් සේවා ආරක්ෂක යනාදිය | _ | 2013.10. 21-22 (මැලේසියාව) |
| 3. | තාක්ෂණික සහයෝගිතාවය හා කාර්මික සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා වියට්නාම් සහයෝගිතා වැඩ සටහන | වගන්ති 05 ක් සහිත ගිවිසුම | 2013 | තාක්ෂණික/ජලරෝපණ සංවර්ධනය | _ | _ |
| 4. | ශ්‍රී ලංකා - වියට්නාම් සහයෝගිතාවැඩ සටහන | වගන්ති 06 ක් සහිත අවබෝධතා ගිවිසුම | 2011.10.14 | තාක්ෂණික | වාර්ෂික පදනම මත වෙනස් කිරීම | _ |
| 5. | ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළඳාම විළිබඳ උපකමිටුව | එකඟවී ඇති වාර්තා | 2015.03.26 | ද්විපාර්ශවික වෙළඳ සහ ආයෝජන | _ | 2015.03.26 (කොළඹ) |
| 6. | ශ්‍රී ලංකාව හා කෙන්යාව අතර ඒකාබද්ධ වෙළඳ කමිටුව | වගන්ති 22 ක් සහිත අවබෝධතා ගිවිසුම | 2013 | තාක්ෂණික භාණ්ඩ වෙළඳාම | දෙපාර්ශවයෙන් එක් පාර්ශවයක් ඉල්ලා සිටින විටදී ශ්‍රී ලංකාවේදී වෙනස් කිරීම | 2014.11.11. (ශ්‍රී ලංකාව) |
| 7. | ශ්‍රී ලංකාව හා ඉරාකය අතර ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාවය සඳහා වන ඒකාබද්ධ කමිටුව | එකඟවී ඇති වාර්තා | _ | _ | _ | 2010.10.20-23 (කොළඹ) |
| 8. | ශ්‍රී ලංකා දකුණු අප්‍රිකා ද්විපාර්ශවික සහයෝගිතා සංසඳය | _ | _ | _ | _ | 2015.02.24-25 (කොළඹ) |
| 9. | බංග්ලාදේශ - ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කොමිසම (JEC) | දෙවන ශ්‍රී ලංකා බංග්ලාදේශ විදේශ කාර්යාල උපදේශන පිළිබඳ එක ඟ වී ඇති වාර්තා (FOC) | 2013.04.22 | _ | _ | 2014.11 17-18 (කොළඹ) |
| 10. | ඉන්දුනීසියාව හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවික සහයෝගිතා වය සඳහා වන ඒකාබද්ධ කොමිසම | එක ඟ වී ඇති වාර්තා (2007.10.01 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ බවට සඳහන් වේ) | 2014.10.13 | ඉතා ඉහළ ආර්ථික | දෙවසරකටවරක් | 2014.10.13 (ජාකර්තා) |
| 11. | බෙලාරුසියාව රජය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ ආර්ථික සහයෝගිතාවය | වගන්ති 22 සහිත ගිවිසුම | 2013.08.26. | නෛතික කරුණු | එක් පාර්ශ්වයක ඉල්ලීම මත කොළඹ සහ මින්ස්ක් නගරවලදී වෙනස් කිරීම | 2014.07.09-10(කොළඹ) |
| 12. | ශ්‍රී ලංකාව හා කොරියාව අතර ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම | _ | _ | _ | _ | _ |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

## 2.3 ආනයනික තීරුබදු ව්‍යුහය

"සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ හා කේත ක්‍රමය" යනුවෙන් සාමාන්‍ය වශයෙන් හඳුන්වන “සංයෝජිත වෙළඳ භාණ්ඩ" යනු ආනයන හා අපනය භාණ්ඩ මත පනවනු ලබන තීරුබදු සහ අනෙකුත් බදු අයකර ගැනීමටත් එකී භාණ්ඩ හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන රේගු තීරුබදු නම්කරණයක් හා වර්ගකරණයකි. ආනයන හා අපනයන වෙළඳ සංඛ්‍යා ලේඛන රැස්කර ගැනීමට ද මෙම ක්‍රමවේදය ඉතා ප්‍රයෝජනවත් වේ. ශ්‍රී ලංකාව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ක්‍රම 8ක් භාවිතා කරන අතර අවසාන සංකේත දෙක, ශ්‍රී ලංකාවේ විශේෂිත අවශ්‍යතාවයන් සඳහා ජාතික උප බෙදීම් වලට අනුරූපී වේ.

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ හා (සංශෝධිත 235 වන අධිකාරිය) රේගු ආඥා පනතේ අන්තර්ගත නීතිමය ප්‍රතිපාදන පදනම් කරගෙන වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබේ.

විවිධ පාර්ශවකරුවන්ට කණ්ඩායම් වලට ඇතිවන බලපෑම් සැලකිල්ලට ගනිමින් විවිධ භාණ්ඩ සඳහා වෙනස් වූ බදු අනුපාතයන් පනවනු ලැබේ. අයිතමයන් කීපයක් හැර, පොදුවේ දේශීය කර්මාන්ත සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍ය, අන්තර් භාණ්ඩ සඳහා පහළ බදු ප්‍රතිශතයක් සහ නිමැවුම් භාණ්ඩ සඳහා ඉහළ බදු ප්‍රතිශතයක්ද ක්‍රියාත්මක වේ. එක් එක් තීරුබදු අනුපාත යටතේ සංයෝජිත සංකේතාංක දක්වන්නා වූ 2015 වර්ෂ අවසානයේ සකස් කරන ලද තීරුබදු ව්‍යුහය පහත වගු අංක 2.11 දක්වා ඇත.

වගුව **2.11 2015** දෙසැම්බර් **31** දිනට තීරුබදු ව්‍යුහය

| අනු පිළිවෙල | බදු අනුපාතය | තීරුබදු කාණ්ඩ සංඛ්‍යාව **(HS 2012 : 8 Digits)** | ප්‍රතිශතය( %) |
|---|---|---|---|
| 1 | Free | 3,922 | 56.31 |
| 2 | 15% | 1,324 | 19.01 |
| 3 | 30% | 1,457 | 20.92 |
| 4 | 75% | 03 | 0.04 |
| 5 | 85% | 01 | 0.01 |
| 6 | 125% | 05 | 0.07 |
| 7 | නිශ්චිත | 67 | 0.96 |
| 8 | නිශ්චිත හා වටිනාකම මත | 186 | 2.67 |
| **එකතුව** | | **6,965** | **100.00** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

2015 නොවැම්බර් මාසයේදී සාමාන්‍ය තීරුබදු 7.5% ඉවත් කර 25% ක්ව තිබූ තීරුබදු 30% දක්වා වැඩිකර ඇත.

**වගුව 2.12 2008 සිට 2015 දක්වා තීරුබදු ව්‍යුහය තුළ සිදු කරන ලද වෙනස්කම්**

| අනු පිළිවෙල | තීරුබදු කාණ්ඩ | තීරුබදු සංකේතාංක ප්‍රමාණයන් (අංක.8 කින් යුතු) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2015** | **2014** | **2013** | **2012** | **2011** | **2010** | **2009** | **2008** |
| 1 | නිදහස් | 3,922 | 3,410 | 3,379 | 3,024 | 3,024 | 2,967 | 764 | 759 |
| 2 | 2.5% | | | | | | | 2,087 | 2,084 |
| 3 | 5% | | | | 410 | 412 | 415 | | 1,563 |
| 4 | 6% | | | | | | | 475 | 466 |
| 5 | 7.5% | | 188 | 184 | | | | | |
| 6 | 15% | 1,324 | 1,601 | 1,590 | 1,587 | 1,508 | 1,516 | 1,541 | |
| 7 | 25% | | 1,450 | 1,415 | | | | | |
| 8 | 28% | | | | | | | 1,382 | 1,366 |
| 9 | 30% | 1,457 | | | 1,504 | 1,323 | 1,327 | | |
| 10 | සුඛෝපභෝගී අනුපාත | 9 | 9 | 9 | 9 | 9 | 9 | 9 | 9 |
| 11 | විශේෂිත/ඒකක අනුපාත | 67 | 84 | 84 | 84 | 77 | 60 | 52 | 51 |
| 12 | විශේෂිත හෝ වටිනාකම් අනුව | 186 | 184 | 183 | 200 | 162 | 193 | 210 | 168 |
| **එකතුව** | | **6,965** | **6,926** | **6,844** | **6,818** | **6,515** | **6,487** | **6,520** | **6,466** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

### 2.3.1 2015 වර්ෂයේදී සංයෝජිත කේත අංක ක්‍රමයට අළුතෙන් එකතු කළ ජාතික උපබෙදීම්

2015 වර්ෂයේදී සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඇති කරන ලද නව ජාතික උප බෙදීම් පරිශීලනය සඳහා 4.1 වගුවේ අමුණා ඇත. (ඇමුණුම -I)

### 2.3.2 ආදයම් සංරක්ෂණ අඥා පනත යටතේ දකුණු අසියානු නිදහස් වෙළඳ ගිවිසුමට (SAFTA) අදාළ තීරුබදු ව්‍යුහය - 2015

ආදයම් සංරක්ෂණ අඥා පනත පරිදි දකුණු අසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ තීරුබදු ව්‍යුහය පරිශීලනය සඳහා 4.2 වගුවේ අමුණා ඇත. (ඇමුණුම - II) ඌන සංවර්ධිත දකුණු ආසියානු රටවල් හා ඌන සංවර්ධිත නොවන දකුණු ආසියානු රටවල් සඳහා ලබාදී ඇති තීරුබදු ව්‍යුහයන් වෙන් වෙන් වශයෙන් පේළිවල දක්වා ඇත.

### 2.3.3 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ සිදු කරන ලද සංශෝධන

1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ අඥාව (ආනයනික රේගු තීරුබදු) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ආදායම් සංරක්ෂණ නියෝග පිළිබඳ විස්තර පරිශීලනය සඳහා 4.3 වගුවේ අමුණා ඇත. (ඇමුණුම - **III**)

## 2.4 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (SCL)

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ වූ නීතිමය ප්‍රතිපාදන යටතේ තෝරාගත් විශේෂ භාණ්ඩ වර්ග ආනයනයේදී තනි සංයුක්ත බද්දක් පැනවීම හා එම බද්ද වරින් වර ගැසට් නිවේදන නිකුත් කිරීම මගින් සංශෝධනය කිරීම සිදුකරනු ලබයි. පාරිභෝගිකයන් උදෙසා සහනදායි මිළ ගණන් පවත්වා ගැනීමටත් අර්තාපල්, බී ළූනු හා රතු ළූනු අස්වැන්න ලැබෙන කාලයේදී දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කර ගැනීමේත් අරමුණින් වරින් වර මෙම බදු සංශෝධනය කරනු ලබයි.

2007 අංක 48 දරන වෙළඳ භාණ්ඩ පනත යටතේ සිදුකරන ලද බදු සංශෝධන පිළිබඳ විස්තර පරිශීලනය සඳහා 4.4 වගුවේඅමුණා ඇත. (ඇමුණුම - **IV)**

## 2.5 තීරුබදු කපා හැරීම්

රේගු ආඥා පනතේ 19(අ) (235 වන අධිකාරිය) වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති විශේෂ ව්‍යාපෘති සඳහා තීරුබදු නිදහස් කළ හැකිය. ඒ අනුව 2015 වර්ෂයේදී මාර්ග හා මහා මාර්ග, ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා, වරාය සහ ධීවර වරාය, ජලසම්පාදන හා වාරිමාර්ග, විදුලිය, නිවාස, රෝහල් සහ විශ්ව විද්‍යාල ඉදිකිරීම් යනාදී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විශේෂ ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද ද්‍රව්‍ය සඳහා තීරුබදු සහන ලබාදෙන ලදි. 2015 වර්ෂයේදී ලබාදෙන ලද තීරුබදු සහන පිළිබඳ තොරතුරු 2.13 වගුවේ දක්වා ඇත.

**වගුව 2.13 2015 වර්ෂයේදී රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ දී ඇති තීරුබදු සහන**

| අනු පිළිවෙල | අංශය | කපා හරින ලද තීරුබදු ප්‍රමාණය |
|---|---|---|
| 1 | ආරක්ෂක | 150 |
| 2 | අධ්‍යාපන | 106 |
| 3 | සෞඛ්‍ය | 101 |
| 4 | යටිතල පහසුකම් | 427 |
| 5 | ජල සම්පාදන | 570 |
| 6 | සුබසාධන | 94 |
| 7 | වෙනත් | 120 |
| **එකතුව** | | **1,568** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

රේගු ආඥා පනතේ 19(අ) වගන්තියට අනුව නියමයෙහි සඳහන් යම් තැනැත්තෙකු විසින් ආනයනය කරන ලද නැතහොත් ඔහු නමට ප්‍රේෂණය කරන ලද යම් භාණ්ඩයක් නියමයෙහි සඳහන් විය හැකි කොන්දේසි වලට යටත්ව ඒ සඳහා අය කළ යුතු රේගු බදු සියල්ලෙන් හෝ ඉන් කොටසකින් පොදු යහපත සඳහා යෝග්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකුන ලැබේ නම්, ඔහු විසින් එසේ කළ හැකිය. ඒ අනුව, ගරු මුදල් අමාත්‍යවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව තීරුබදු කපා හැරීම ක්‍රියාත්මක කිරීම, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ( 2015 වර්ෂයේදී කපා හරින ලද තීරුබදු ප්‍රමාණයන් 2.14 වගුවේ දැක්වේ)

2015 වර්ෂයේ කපා හරින ලද තීරුබදු ප්‍රමාණයන් 2.14 සටහනේ දක්වා ඇත.

**වගුව 2.14රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය යටතේ පොදු තීරුබදු කපා හැරීම**

| අනු පිළිවෙල | අයිතමය | වර්තමාන රේගු ආනයන බද්ද | තීරුබදු කපා හැරීම | අයකර ගත හැකි තීරු බදු | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| 1 | ඩීසල් | ලීටරයක් සඳහා රු. 15/- | ලීටරයක් සඳහා රු. 06/- | ලීටරයක් සඳහා රු. 9/- | 2014.12.05 සිට අද දක්වා |
| 2 | කිරිපිටි | 25% හෝ කි.ග්‍රෑම් 1 කට රු.225/- | කි.ග්‍රෑම් 1කට රු.90/- | කි.ග්‍රෑම් 1කට රු.135/- | 2014.11.08 සිට 2015.07.22 දක්වා |
| | | | කි.ග්‍රෑම් 1කට රු.45/= | කි.ග්‍රෑම් 1 කට රු.180/- | 2015.07.23 සිට 2015.08.05 දක්වා |
| | | 20% හෝ කි.ග්‍රෑම් 1 කට රු.225/- | නොමැත | 20% හෝ කි.ග්‍රෑම් 1- රු.225/- | 2015.08.06 සිට අද දක්වා |
| 3 | තිරිඟු ඇට | 15% හෝ කි.ග්‍රෑම් 1කට රු.10 | සියලු බදු | නොමැත | 2015.01.30 සිට 2016.02.09 දක්වා |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

## 2.6 ආයෝජන

### 2.6.1 විදේශ සෘජු ආයෝජන (FDI)

ආයෝජන මණ්ඩල නිශේධ ලැයිස්තුව 2014 වර්ෂයේදී හඳුන්වා දීමත් සමඟ ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව කලට වේලාවට දේශීය වශයෙන් මිලදී ගත නොහැකි නිශේධ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ අයිතමයන් සඳහා අනුමැතිය ලබාදීමේ අධිකාරි බලය මෙම දෙපාර්තමේන්තුව සතුවේ. 2015 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් නිශේධ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ අයිතමයන් තීරුබදු රහිත පදනම මත ආනයනය කිරීමට අවස්ථා 16 කදී අනුමැතිය ලබා දී ඇති අතර එකී ඉල්ලීම්වල තොරතුරු පහත පරිදි වේ. (වගුව 2.15)

**වගුව 2.15 ආයෝජන මණ්ඩල නිශේධන ලැයිස්තුව යටතේ ආයෝජන මණ්ඩලයෙන් කරන ලද ඉල්ලීම්**

| අනු පිළිවෙල | අයිතමය | මුළු ඉල්ලීම් ගණන | අනුමැතිය දුන් | අනුමැතිය නොදුන් |
|---|---|---|---|---|
| 1 | වෙර ගැන්වූ වානේ | 01 | - | 01 |
| 2 | සෙරමික්/පෝසිලේන්, වෝල් ටයිල්, ෆ්ලෝ ටයිල්, මාර්බල් ෆ්ලෝ ටයිල්, ග්‍රැනයිට් සහ ක්වාට්ස් ටයිල් | 02 | 02 | - |
| 3 | පිඟන් මැටි වලින් තැනූ සෝදන බේසම්/බිඩේ/නාන බේසම්/ යූරිනල් ආදී උපාංග | 08 | 08 | - |
| 4 | ලිහිසි තෙල් | 01 | 01 | - |
| 5 | ගෘහ භාණ්ඩ | 04 | 03 | 01 |
| එකතුව | | **16** | **14** | **02** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

### 2.6.2 විදේශ රටවල කරනු ලබන ආයෝජන (බාහිර විදේශීය ආයෝජන)

බාහිර විදේශ ආයෝජන කටයුතු සඳහා විනිමය පාලන ප්‍රතිපත්ති ලිහිල් කර තිබුණද, එවැනි ආයෝජන සඳහා විනිමය පාලන පනතේ 17(2) වගන්තිය යටතේ මුදල් විෂයභාර ගරු අමාත්‍යතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුව ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් විෂයභාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඔවුන්ගේ නිර්දේශ සහිතව එවැනි ව්‍යාපෘති පිළිබඳ යෝජනා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, 2015 වසරේ බාහිර විදේශ ආයෝජන සඳහා අනුමත ව්‍යාපෘති පහත දක්වා ඇත.

**වගුව 2.16 2015 වර්ෂයේදී අනුමත කරන ලද විදේශ ආයෝජන**

| අනු පිළිවෙල | ආයෝජකයාගේ නම | ආයෝජන | වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන |
|---|---|---|---|
| 1 | සී/ස ස්ටාර් පැක් ඉන්වෙස්මන්ට්ස් සමාගම, අක්බාර් බ්‍රදර්ස් (පුද්) සමාගම සහ සී/ස ඉන්වෙස්මන්ට්ස් (පුද්) සමාගම | ඉන්දියානු ස්ටෙලා ප්ලාස්ටික් ප්‍රයිවට් ලිමිටඩ්හි කොටස් 100පවරා ගැනීම | 4.50 |
| 2 | සී/ස ලවියානි හෝල්ඩින් (පුද්) සමාගම | මාලදිවයිනේ කොන්කුන් ඉන්වෙස්ට්මන් ප්‍රයිවෙට් ලිමිටඩ් හි කොටස් 55% පවරා ගැනීම | 10.00 |
| 3 | සී/ස ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ආයතනය | ජේඔඑච්සීඑම් ඒසියා එක්සි ජපන් අරමුදලේ ආයෝජනය කිරීම | 0.75 |
| 4 | ස්ටාර් පැකේජින් (පුද්) සමාගම | ඉන්දියාවේ රීගල් පැක් බොක්සස්හි ආයෝජනය කිරීම | 1.00 |
| 5 | ෂිරොන්කෝ ස්මෝල් හයිඩ්‍රෝ පවර් ප්‍රොජෙක්ට් | උගන්ඩාවේ එකෝ ක්ලීන් පවර් ලිමිටඩ්හි ආයෝජනය කිරීම | 7.85 |
| 6 | මාලදිවයින් ලංකා හොටෙල්(පුද්) සමාගම | මාලදිවයිනේ හැන්ඩ්හුවාරු ඕෂන් හොල්ඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කොටස් 100% පවරා ගැනීම | 11.00 |
| 7 | එම්පයර් තේ (පුද්) සමාගම | කෙන්යාවේ එම්පයර් කෙන්නියා ඊපීඉසෙඩ් හි කොටස් 75% පවරා පවරා ගැනීම | 0.30 |
| 8 | ලාෆ්ස් ගෑස් පීඑල්සී | බංගලා දේශයේ පෙට්‍රිඩෙක් පීඑල්සී ලිමිටඩ් හි කොටස් 69% පවරා ගැනීම | 18.70 |
| 9 | වින්ඩ්පෝර්ස් (පුද්) සමාගම | පකිස්තානයේ හරප්පා සෝලා (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් 10% පවරා ගැනීම | 0.70 |
| 10 | එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී | පීජී රටේ පීජී පෝට්ස් කෝපරේෂන්හි කොටස් 20% පවරා ගැනීම. | 17.00 |
| **එකතුව** | | | **71.80** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

## 2.7 ජාත්‍යන්තර සහයෝගිතාවය

### 2.7.1 සාර්ක් සංවර්ධන අරමුදල (SDF)

සාර්ක් සංවිධානයේ සියලුම සාමාජික රටවල් විසින් කලාපය තුළ විවිධාකාරයේ අරමුදල් පවත්වා ගැනීම හේතුවෙන් ඇති විය හැකි ගැටළු සහගත තත්ත්වයන් අවම කර ගැනීම පිණිස සාර්ක් වැඩ සටහන්/ ව්‍යාපෘති මූල්‍යානය කළ හැකි එක් යාන්ත්‍රණයක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාවය මත සාර්ක් සාමාජික රටවල් විසින් සාර්ක් සංවර්ධන අරමුදල පිහිටුවා ගන්නා ලදී.

සමස්ත කාර්යයන් සම්බන්ධීකරණය, ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීම, ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම, වාර්ෂිකව දායක මුදල් සම්පාදනය කිරීම, සාර්ක් සංවර්ධන අරමුදලේ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා සංචාරවලදී ඔවුනට අවශ්‍ය පහසුකම් සලසා දීම ඇතුළු කාර්යයන් රැසක් සාර්ක් සංවර්ධන අරමුදලේ ශ්‍රීලංකා ප්‍රතිපාර්ශවීය ආයතනය වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ඉටුකරනු ලැබේ. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පිළිවෙලින් මෙම අරමුදලේ අධ්‍යක්ෂ හා වෛකල්පිත අධ්‍යක්ෂ වශයෙන් පත් කර ඇත. ඒ අනුව, සමාලෝචිත වසර තුළදී මහා භාණ්ඩාගාර නිලධාරීන් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නියෝජනය කරන ලදී.

**වගුව 2.17 2015 දී පවත්වන ලද සාක් සංවර්ධන අරමුදලේ රැස්වීම්**

| අනු පිළිවෙල | රැස්වීමේ නම | දිනය |
|---|---|---|
| 1 | 4 වන පාලන සභාවේ රැස්වීම | අගෝස්තු 20 |
| 2 | 31 වන සාර්ක් මූල්‍ය කණ්ඩායමේ රැස්වීම | ඔක්තෝම්බර් 08 |
| 3 | 22 වන සාර්ක් මූල්‍ය සම්බන්ධීකාරවරුන්ගේ රැස්වීම | අගෝස්තු 17 |
| 4 | 30 වන සාර්ක් මූල්‍ය ආණ්ඩුකාරවරුන්ගේ රැස්වීම | ජූනි 12 |
| 5 | 7වන සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ රැස්වීම | අගෝස්තු 19 - 20 |
| 6 | 7වන සාර්ක් මුදල් ලේකම්වරුන්ගේ රැස්වීම | අගෝස්තු 19 - 20 |
| 7 | 9වන සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ විධිමත් රැස්වීම | මැයි 30 |
| 8 | සාර්ක් සංවර්ධන අරමුදල් මණ්ඩලයේ 21 වන රැස්වීම | අප්‍රේල් 24 - 26 |
| 9 | සාර්ක් සංවර්ධන අරමුදල් මණ්ඩලයේ 22 වන රැස්වීම | අගෝස්තු 18 |
| 10 | සාර්ක් සංවර්ධන අරමුදල් මණ්ඩලයේ 23 වන රැස්වීම | දෙසැම්බර් 29 - 30 |
| 11 | CSABAH , සා.ස.අ, ඊට අදාළ ආයතන සහ CIAS හි ඒකාබද්ධ රැස්වීම | ඔක්තෝම්බර් 28 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

මෙයට අමතරව, සාර්ක් සංවර්ධන අරමුදල යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් හා ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් එම ව්‍යාපෘතීන් හි ප්‍රගතිය සම්බන්ධයෙන් සෘජු අධීක්ෂණයක් කිරීමට තීරණය කරන ලදි.

සාර්ක් සංවර්ධන අරමුදලේ මූල්‍යමය අනුග්‍රහ යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

1. සාර්ක් කලාපයේ ගෘහ කර්මාන්ත වල නිරත වන්නන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම පිළිබඳ වැඩසටහන (පියවර I හා II)
2. මාතෘ හා ළමා සෞඛ්‍යය වැඩිදියුණු කිරීමේ වැඩසටහන
3. දකුණු ආසියාවේ ළමා හිංසනය පිටුදැකීමේ වැඩසටහන (SAIEVAC)
4. සාර්ක් රටවල පසු අස්වනු තාක්ෂණ කළමනාකරණය හා පළතුරු නිෂ්පාදන වල අගය එකතු කිරීම පිළිබද වැඩසටහන
5. ජල ප්‍රවිශ්‍යය පිළිබද වැඩසටහන (WASH)
6. කාන්තා හා ළමා පිළිසරණ සඳහා වන වැඩසටහන

## 2.8 බන්ධිත භාණ්ඩ

රේගු ආඥා පනතේ 69 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චිත කොන්දේසිවලට යටත්ව සුවිශේෂී කාර්යයන් සඳහා අදාළ තීරු බදු සහ ගාස්තු සුරක්ෂිත කර ගැනීමෙන් පසුව ආනයන භාණ්ඩ ගුදම් කර තැබීම හෝ බන්ධිත භාණ්ඩ ලෙස තබා ගැනීම සඳහා ගරු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගුදම් හෝ ස්ථාන නම් කරනු ලැබේ.

රේගු ආඥා පනතේ 69 වන වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කර ඇති කවර හෝ ගුදමක් තුළ භාණ්ඩ සැකසීම, නිෂ්පාදනය හෝ එකලස් කිරීම සඳහා රටේ ආර්ථික සංවර්ධනය උදෙසා අවසර ලබා දීමට රේගු ආඥා පනතේ 84 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට නීතිමය බලය හිමි වේ. දැනට පහත සඳහන් ගුදම් වර්ග පවත්වා ගෙන යනු ලබයි.

- දේශීය පරිභරණයට සහ නැවත අපනයනය සඳහා වන සීනි, සහල් ඇතුළු භාණ්ඩ සැපයීම සඳහා වන ගුදම්
- අපනයනය ප්‍රමුඛ කර්මාන්ත සඳහා භාණ්ඩ සැපයෙන ගුදම්
- සේවා ගුදම්, පෝෂණ බැඳි ගුදම් හා ගුවන් තොටුපලේ හෝ වරායේ ඇති තීරු බදු නිදහස් සාප්පු
- ගුවන් යානා සහ නැව් සඳහා භාණ්ඩ සැපයෙන ගුදම්
- නිෂ්පාදන ගුදම්
- විවිධ රටවලින් ආනයනය කර, ප්‍රති අපනයනය සඳහා ස්ථාපිත කර ඇති ගුදම්
- මගීන් කැටුව නොගෙනෙන ගමන් බඩු නිෂ්කාශන ගුදම්
- සීඝ්‍රගාමී ගුදම් නිෂ්කාශනය (තැපැල් මලු)

බන්ධිත ගුදම්වලට අදාළව රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ අධ්‍යයනය කර ගරු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයකි. 2015 වර්ෂය තුළදී ගරු මුදල් අමාත්‍යවරයාට අයදුම්පත් 12 ක් ඉදිරිපත් කළ අතර බන්ධිත ගුදම් 06 ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර 01ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඉතිරි අයදුම්පත් අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියේ පවතී.

තවද පවතින අවශ්‍යතා සහ ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමේ රජයේ ප්‍රමුඛතාව සැලකිල්ලට ගෙන සහ කර්මාන්ත සංවර්ධන අංශයේ නිර්මානය වන අවශ්‍යතා සපුරාලීම පිණිස, රේගු ආඥා පනතේ 69 වන වගන්තිය යටතේ පොදු බන්ධිත ගුදම් සඳහා නව ප්‍රතිපත්ති රාමුවක් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

# 3. පරිපාලන හා මූල්‍ය කාර්ය සාධනය

## 3.1 පරිපාලන අංශය

මෙම දෙපාර්තමේන්තුව සඳහා 2015 වසරට අනුමත කාර්ය මණ්ඩලය 57 කි. දැනට කාර්ය මණ්ඩලය 53 දෙනෙකුගෙන් සමන්විත වන අතර, පුරප්පාඩු 4 ක් පවතී. දෙපාර්තමේන්තුවේ පරිපාලන හා මානව සම්පත් සංවර්ධනය කාර්යයන් පරිපාලන හා මූල්‍ය අංශය විසින් ඉටුකරන ලදි. ඒ සම්බන්ධ සංඛ්‍යාත්මක තොරතුරු පහත පගුවෙහි දක්වා ඇත.

**වගුව 3.1 2015.12.31.දිනට අනුමත කාර්යමණ්ඩලය**

| අනු පිළිවෙල | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 3 | අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ I) | 03 | 03 | - |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ II, III) | 07 | 05 | 02 |
| 5 | නියෝජ්‍යඅධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(ශ්‍රී.ලං.ක්‍ර.සේ II, III) | 01 | - | 01 |
| 6 | ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ. III) | 01 | 01 | - |
| 7 | පර්යේෂණ සහකාර | 10 | 09 | 01 |
| 8 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 20 | - |
| 9 | රියදුරු | 05 | 05 | - |
| 10 | කාර්යාල සහායක සේවය | 07 | 07 | - |
| 11 | බයිසිකල් පණිවිඩකරු | 01 | 01 | - |
| එකතුව | | **57** | **53** | **04** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

**2015 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ නිලධාරීන්**

1. කේ.ඩී.එන්. රංජිත් අසෝක මහතා — අධ්‍යක්ෂ ජනරාල්
2. බී.පී.සී. කුලරත්න මහතා — අධ්‍යක්ෂ
3. එස්.ඩබ්.සී. ජයමිණි මිය — අධ්‍යක්ෂ
4. ආර්.එල්. වීරසේකර මහතා — සහකාර අධ්‍යක්ෂ
5. එච්.ජී.ටී.ප්‍රසංගිකා මිය — සහකාර අධ්‍යක්ෂ
6. ඩී.කේ. ඔෂානි මිය — සහකාර අධ්‍යක්ෂ
7. ජී.ඩී.එස්.පී. කුමාර මහතා — සහකාර අධ්‍යක්ෂ
8. ජේ.ඒ.ඩී.යූ. රණසිංහ මිය — සංවර්ධන නිලධාරි

9. කේ.එම්.ජී.කේ. කස්තුරි මෙය සංවර්ධන නිලධාරි
10. ඩී.අයි. ද එස්. විජයසිංහ මිය සංවර්ධන නිලධාරි
11. එම්. නන්දනී මෙය සංවර්ධන නිලධාරි
12. එස්.ඩබ්.ජී.එම්. කරුණාරත්න මහතා සංවර්ධන නිලධාරි
13. බී.එල්.ඩී. සුදර්ශන මහතා සංවර්ධන නිලධාරි
14. ඩබ්.ආර්.ආර්. වික්‍රමසිංහ මෙය කළමනාකරණ සහකාර
15. ජේ.ඩී.එස්.ඩී.ජේ. ප්‍රනාන්දු මිය කළමනාකරණ සහකාර
16. එල්.ඒ.එස්.පී. විජේබණ්ඩාර මිය කළමනාකරණ සහකාර
17. සරෝජිනී පුෂ්පලතා මිය කළමනාකරණ සහකාර
18. ජී.ඩී. පිටිදූවගේ මෙය කාර්යාල කාර්ය සහායක
19. එම්.එම්.එම්. රිම්ෂාන් මහතා කාර්යාල කාර්ය සහායක
20. ආර්.ඒ.ඩී.සී.ප්‍රියදර්ශන මහතා රියදුරු
21. ආර්.කේ.කේ. කුමාරසිරි මහතා රියදුරු
22. කේ. ජයසිරි මහතා රියදුරු
23. එල්.ඒ.වී.සී. ජිනේන්ද්‍ර මහතා රියදුරු

**2015 වසරේදී දෙපාර්තමේන්තුව හැර ගිය නිලධාරීන්**

1 ආර්. සේමසිංහ මහතා අධ්‍යක්ෂ ජනරාල්
2. ඩී.සී. ජයදේව මිය අධ්‍යක්ෂ
3. එම්.කේ.ඒ.ඒ. අමාලි මෙය සහකාර අධ්‍යක්ෂ
4. කේ. මීගහගේ මහතා සහකාර අධ්‍යක්ෂ
5. එම්.ඒ.සී. පද්මිණී මිය සංවර්ධන නිලධාරි
6. අයි.ඩී. ශ්‍රියානි මිය කළමනාකරණ සහකාර
7. එස්.එල්. විදානපතිරණ මහතා කළමනාකරණ සහකාර
8. කේ. සුන්දරලිංගම් මිය කළමනාකරණ සහකාර
9. එල්.ඒ. සුනිල් ශාන්ත මහතා කාර්යාල කාර්ය සහායක
11. කේ.එම්. කරුණාසේන මහතා රියදුරු

**වගුව 3.2 පුහුණු පාඨමාලා/අධ්‍යයන චාරිකා /විදේශ සම්මන්ත්‍රණ 2015**

| තනතුර | නම | රට | කාලය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | කේ.ඩී.එන්. රංජිත් අසෝක මහතා | පකිස්තානය | 17.08.2015<br>19.08.2015 |
| | | භූතානය | 29.12.2015<br>30.12.2015 |
| | ආර්. සේමසිංහ මහතා | නේපාලය | 23.04.2015<br>28.04.2015 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | කේ.ඒ.එස්.එස්.කේ.පෙරේරා මහතා | ජපානය | 17.02.2015<br>19.02.2015 |
| | | ජපානය | 25.11.2015<br>26.11.2015 |

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ | බී.පී.සී. කුලරත්න මහතා | තායිලන්තය | 07.09.2015<br>09.09.2015 |
| | කේ.ඒ. විමලේන්තිරරාජා මහතා | බංග්ලාදේශය | 17.05.2015<br>18.05.2015 |
| | | පිලිපීනය | 27.10.2015<br>28.10.2015 |
| | | තායිලන්තය | 05.11.2015<br>06.11.2015 |
| | | ඉන්දියාව | 21.12.2015 |
| | ඩී.සී. ජයදේව මිය | කොරියාව | 16.03.2015<br>20.03.2015 |
| සහකාර අධ්‍යක්ෂ | කේ. මීගහගේ මහතා | ඉන්දියාව | 02.02.2015<br>06.02.2015 |
| | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා | ස්වීඩනය | 12.04.2015<br>08.05.2015 |
| | | කොරියාව | 19.10.2015<br>24.10.2015 |
| | | තායිලන්තය | 22.12.2015<br>23.12.2015 |
| | එල්.ඒ.ජී.එන්.ලියනාරච්චි මිය | සිංගප්පූරුව | 24.02.2015<br>27.02.2015 |
| | | චීනය | 01.07.2015<br>21.07.2015 |
| | | තායිලන්තය | 27.07.2015<br>28.07.2015 |
| | ආර්.එස්. දොරනෑගොඩ මෙය | ජපානය | 18.01.2015<br>05.02.2015 |
| | රුචිර එල්. වීරසේකර මහතා | පකිස්තානය | 06.02.2015<br>07.02.2015 |
| | | මැලේසියාව | 29.11.2015<br>13.12.2015 |
| පර්යේෂණසහකාර | කේ.ඩී.ජේ. වසන්ත මහතා | චීනය | 16.06.2015<br>06.07.2015 |
| | ඩී.එම්.ඒ. දසනායක මහතා | චීනය | 20.05.2015<br>02.06.2015 |
| | එස්.පී.එම්.ඩී. විජේවර්ධන මහතා | චීනය | 04.06.2015<br>24.06.2015 |
| සංවර්ධන නිලධාරි | ඩී.අයි. ද එස්. විජයසිංහ මිය | චීනය | 15.10.2015<br>04.11.2015 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

**වගුව 3.3 දේශීය පුහුණු පාඨමාලා /අධ්‍යයන චාරිකා/සම්මන්ත්‍රණ - 2015**

| තනතුර | නම | Course | කාලය |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ | ආර්.එස්. දොරනෑගොඩ මෙය | Sri Lanka Public Sector Accounting Standards | 12.06.2015 |
| | කේ. මීගහගේ මහතා | Managing Employee Performance Setting Key Result Areas and Formulating Key Performance Indicators for Organizational Growth | 16.06.2015<br>17.06.2015 |
| | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා | Anticorruption Seminar | 09.09.2015<br>10.09.2015 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ඩබ්.එස්.පී. පෙරේරා මිය | කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රමවේදය | 30.03.2015<br>31.03.2015 |
| | එම්. කිරුහා මිය | කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රමවේදය | 30.03.2015<br>31.03.2015 |
| | එස්.ජී. නිලන්ති මිය | මූලික ප්‍රසසම්පාදන ක්‍රම | 31.03.2015 |
| | | Maintenance of Office Equipments | 14.09.2015<br>15.09.2015 |
| | සී.පී.කේ. විජේසූරිය මහතා | Basic Procurement System | 31.03.2015 |
| | එම්.ජී.එම්.ඩී.විමලරත්න මෙය | ගිණුම් පොත් නඩත්තු කිරීම | 06.04.2015<br>07.04.2015 |
| | කේ.කේ. අතුකෝරල මෙය | ගිණුම් පොත් නඩත්තු කිරීම | 06.04.2015<br>07.04.2015 |
| | එම්.ඒ.ඩී.එස්. මල්ලවආරච්චි මිය | නිවාඩු ලිපිකරුගේ වගකීම | 29.06.2015<br>30.06.2015 |
| | | Maintenance of Office Equipments | 14.09.2015<br>15.09.2015 |
| | එම්.එන්. දිල්රුක්ෂි මිය | Advance account of Government Officers | 02.11.2015<br>03.11.2015 |
| රියදුරු | කේ.ඩී. තුසිත මහතා | Developing Attitudes and professional skills of drivers | 26.06.2015<br>27.06.2015 |
| | ආර්.ඒ.ඩී.සී.ප්‍රියදර්ශන මහතා | Developing Attitudes and professional skills of drivers | 26.06.2015<br>27.06.2015 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

## 3.2 විශේෂ ව්‍යාපෘති යෝජනා ක්‍රම

### 3.2.1 සහන කොන්දේසි යටතේ රාජ්‍ය සේවකයන් සඳහා වාහන ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය

2015 නොවැම්බර් මස 20 වන දින ගරු මුදල් අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලද 2016 අයවැය යෝජනාවල එක් යෝජනාවකට අනුව අංක 01/2013(i) සහ 01/2013 (iii) චක්‍රලේඛ මත සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය මෙම දෙපාර්තමේන්තුව විසින් අංක 01/2013 (iv) චක්‍ර ලේඛය මගින් අත් හිටුවා ඇත.

### 3.2.2 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

2016 අයවැය කතාවේ ප්‍රතිඵලයක් වශයෙන්, සියලුම සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර යෝජනා ක්‍රම අවලංගු කරන ලදී. මේ නිසා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2012 යටතේ අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් වැනි තනතුරු සඳහා රාජ්‍ය සේවයෙන් පරිබාහිරව පත් කරනු ලබන නිලධාරීන් සඳහා වන රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 22/99 සහ ඊට අදාළ සංශෝධන සඳහන් බලපත්‍ර නිකුත් කිරීම ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2015.11.20 වන දින පාර්ලිමේන්තුවට යෝජනා කරමින් 2015.01.21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලදී. 2015.11.20 දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ විශ්‍රාම ගත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා බලපත්‍ර 167 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2013 යටතේ රාජ්‍ය සේවයෙන් පරිබාහිරව විශේෂ අවස්ථාවලදී පත් කරනු ලැබූ අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලපත්‍ර 13 ද නිකුත් කර ඇත.

තවද, 2015 වර්ෂය තුළ විදේශ දූත මණ්ඩලයන්හි සේවා කාලය අවසන් කොට නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන නිලධාරීන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක 210 සහ 210 (i) චක්‍ර ලේඛය යටතේ මෝටර් රථ ආනයන බලපත්‍ර 57 ක් නිකුත් කර ඇත.

## 3.3 මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදන වලින් පුනරාවර්තන වියදම් සඳහා රු. 1,157,091,500/- ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.4,673,500 ක ප්‍රතිපාදන ද ඇතුළුව රු.1,161,765,000/- ප්‍රතිපාදන මුදලක් 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 244 වැඩ සටහන 01 හා ව්‍යාපෘතිය 01 යටතේ වෙන්කර තිබුණි. වසර තුළ මුළු සත්‍ය වියදම් රු..1,161,004,836 ක් වූ අතර සත්‍ය පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු. 1,156,558,922 ක් හා රු.4,445,914 ක් විය.එකී වර්ෂය තුළ එම වියදම බෙදී ගිය ආකාරයත්, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තරත් පිළිවෙලින් පහත වගු අංක 3.4 සහ 3.5 මගින් පෙන්නුම් කෙරේ.

වගුව 3.4 2015 වර්ෂය තුළ අයවැය ඇස්තමේන්තු උපයෝජනය

| අනු පිළිවෙල | වියදම් පිළිබඳ විස්තරය | අයවැය2015 (රු.) | 2015 සත්‍ය වියදම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1 | **පුනරාවර්තන වියදම්** | | | |
| | පුද්ගල පඩිනඩි | 25,270,000 | 25,002,338 | 98.9 |
| | ගමන් වියදම් | 4,607,000 | 4,605,848 | 99.9 |
| | සැපයීම් | 1,900,000 | 1,876,129 | 98.7 |
| | නඩත්තු වියදම් | 1,458,500 | 1,450,117 | 99.4 |
| | සේවා | 2,906,000 | 2,903,209 | 99.9 |
| | මාරුකිරීම් | 1,120,950,000 | 1,120,721,281 | 99.9 |
| | **මුළු එකතුව** | **1,157,091,500** | **1,156,558,922** | **99.9** |
| 2 | **ප්‍රාග්ධන වියදම්** | | | |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1,000,000 | 929,279 | 92.9 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 3,100,000 | 2,943,316 | 94.9 |
| | හැකියා වර්ධනය | 573,500 | 573,319 | 99.9 |
| | **මුළු එකතුව** | **4,673,500** | **4,445,914** | **95.1** |
| **මුළු එකතුව** | | **1,161,765,000** | **1,161,004,836** | **99.9** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

පහත 3.5 වගුවෙන් පෙන්වා ඇති පරිදි වර්ෂය තුළ පාර්ලිමේන්තුවෙන් අනුමත කරන ලද සීමාවන් තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම් පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුවට හැකි විය.

වගුව 3.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම 2015

| අනු පිළිවෙල | විස්තරය | අනුමත ප්‍රමානය (රු.) | සත්‍ය මුදල් වටිනාකම (රු) |
|---|---|---|---|
| 1 | වියදමේ උපරිම සීමාව | 2,500,000 | 1,612,183 |
| 2 | ලැබීම් වල අවම සීමාව | 1,200,000 | 1,859,599 |
| 3 | හර ශේෂයේ උපරිම සීමාව | 12,000,000 | 8,322,997 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2015*

## 3.4 විගණන විමසුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලද සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදුන් අතර අවශ්‍ය අවස්ථාවලදී දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. විගණන විමසුම් වල තොරතුරු අංක 4.5 සහ 4.6 වගුවල අමුණා ඇත. (ඇමුණුම් V සහ ඇමුණුම් VI)

# 4.ඇමුණුම්

ඇමුණුම - I

**4.1 වගුව - සංයෝජිත වර්ගීකරණ සඳහා ජාතික උප බෙදුම් - 2015**

| අනු අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | 2015 දී විස්තරය | තීරුබදු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | 33030021 | SLS 589 ප්‍රමිතියට අනුකූල හා මධ්‍යසාර ප්‍රතිශතය 55% ට නොඅඩු සහ 65% ට නොවැඩි ලදරුවන් සඳහා වන කොලෝන් වර්ග | නිදහස් |
| 2 | 33030022 | SLS 534 ප්‍රමිතියට අනුකූල හා මධ්‍යසාර ප්‍රතිශතය 50% ට නොඅඩු සහ 90% ට නොවැඩි ලදරුවන් සඳහා වන කොලෝන් වර්ග | නිදහස් |
| 3 | 33030029 | අනෙකුත් : | 30% |
| 4 | 39239010 | මුද්‍රණයෙන් හඳුනාගත හැකි පරිදි දන්තාලේප ඇසිරීම සඳහා සූදානම් කරන ලද, නිමවන ලද කර සහිත හැකිලිය හැකි ටියුබයන් ,මුඩිය ඇතිව හෝ නැතිව | 15% |
| 5 | 39269091 | වී තවාන් දැමීම සඳහා යොදාගන්නා තැටි | 15% හෝ කි.ග්‍රෑමයට රු 20/= |
| 6 | 39269099 | අනෙකුත් : | 15% හෝ කි.ග්‍රෑමයට රු 20/= |
| 7 | 65061010 | වැඩබිම්, පතල් හා සමාන ස්ථානයන්හි පළඳින මූලික ආරක්ෂණ හිස් වැසුම් | 15% |
| 8 | 65061020 | පළඳින්නාගේ හිස පසුපස හිස් කබලේ පාමුල දක්වාම ආවරණය කෙරෙන, එහෙත් හිස් ආවරණයෙන් ඉදිරියට නෙරා ගිය තිකට ආවරණයක් රහිත හා එවැනි තිකට ආවරණයක් සවිකිරීමට ප්‍රතිපාදන රහිත, මුහුණු ආවරණයක් සහිත හෝ රහිත එහෙත් පළඳින්නා හඳුනාගැනීම අවහිර කරන අන්දමේ ආලේපිත හෝ අව පැහැ ගැන්වූ මුහුණු ආවරණයක් රහිත, SLS 517 ප්‍රමිතියට අනුගත වන සේ ආනයන කරන ලද හා (පහත දැක්වෙන දේශීය උප ශීර්ෂයන්හි ගැනෙන දැ හැර) යතුරු පැදි ධාවකයින් පළඳින වර්ගයේ වූ ආරක්ෂණ හිස් වැසුම් | 15% |
| 9 | 65061030 | SLS 517 (A කාණ්ඩය) ප්‍රමිතියට අනුගත වන හා ආනයන පාලකගේ පූර්ව අනුමැතියට යටත්ව ආනයනය කරන ලද මෝටර් වාහන/යතුරුපැදි තරඟ හෝ ක්‍රීඩා ඉසව් හෝ ආරක්ෂක ක්‍රියාදාමයන් වැනි විශේෂිත අවස්ථා වලදී පළඳින වර්ගයේ ආරක්ෂණ හිස් වැසුම් | 15% |
| 10 | 65061040 | ආනයන පාලකගේ පූර්ව අනුමැතියට යටත්ව ආනයනය කරන ලද හා පාපැදි තරඟ ඉසව් වලදී පළඳින වර්ගයේ (දිගැටි හැඩැති) ආරක්ෂණ හිස් වැසුම් | 15% |
| 11 | 65061050 | ආනයන පාලකගේ පූර්ව අනුමැතියට යටත්ව ආනයනය කරන ලද යතුරුපැදි කරුවන් පළඳින වර්ගයේ ආරක්ෂණ අර්ධ (හිස පසුපස කොටස ආවරණය නොකරන) හිස් වැසුම් | 15% |
| 12 | 65061090 | අනෙකුත් : | 15% |
| 13 | 84182190 | අනෙකුත් : | 15% |
| 14 | 87032163 | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 300 නොඉක්මවූ ක්වාඩ්‍රිසයිකල් (Quadricycle) ඇතුළුව | 30% |
| 15 | 87032172 | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 300 නොඉක්මවූ ක්වාඩ්‍රිසයිකල් (Quadricycle) ඇතුළුව | 30% |
| 16 | 87039011 | අවුරුදු දෙකකට වඩා නොපැරණි විදුලි බලයෙන් ක්‍රියාකරන සවයංක්‍රීය ත්‍රිරෝද රථ | නිදහස් |
| 17 | 87039012 | අවුරුදු දෙකකට වඩා පැරණි විදුලි බලයෙන් ක්‍රියාකරන සවයංක්‍රීය ත්‍රිරෝද රථ | 15% |
| 18 | 87039021 | අවුරුදු තුනකට වඩා නොපැරණි, විදුලි බලයෙන් ක්‍රියාකරන අනෙකුත් අභ්‍යන්තර දහන එංජින් නොමැති එහෙත් වාහනයට සවි කරන ලද, සූර්ය විදුලි පැනල මගින් උත්පාදනය වන විදුලියෙන් ආරෝපණය වන ඇකියුම්ලේටර් මගින් පමණක් බල ගැන්වෙන විදුලි මෝටර් මගින් ධාවනය වන | 15% |

| | | | |
|---|---|---|---|
| 19 | 87039022 | අවුරුදු තුනකට වඩා නොපැරණි, විදුලි බලයෙන් ක්‍රියාකරන අනෙකුත් අභ්‍යන්තර දහන එංජින් නොමැති එහෙත්, බාහිර විදුලි ප්‍රභවයන් (උදා: ජාතික විදුලි පද්ධතිය) මගින් ආරෝපණය වන වාහනයට සවි කරන ලද, ඇකියුම්ලේටර් මගින් බල ගැන්වෙන විදුලි මෝටර් මගින් ධාවනය වන | 15% |
| 20 | 87039023 | අවුරුදු තුනකට වඩා නොපැරණි, විදුලි බලයෙන් ක්‍රියාකරන අනෙකුත් බාහිර විදුලි ප්‍රභවයන් (උදා: ජාතික විදුලි පද්ධතිය) මගින් ආරෝපණය වන වාහනයට සවි කරන ලද, ඇකියුම්ලේටර් මගින් බල ගැන්වෙන විදුලි මෝටර් මගින් ධාවනය වන හා ජෙනරේටරය ධාවනය කිරීමෙන් විදුලිය උත්පාදනය කර ගැනීම සඳහාම පමණක් යොදාගත හැකි අභ්‍යන්තර දහන එංජිමක් සහිත | 15% |
| 21 | 87039029 | අනෙකුත් : | 15% |
| 22 | 87039031 | අවුරුදු තුනකට වඩා පැරණි, විදුලි බලයෙන් ක්‍රියාකරන අනෙකුත් අභ්‍යන්තර දහන එංජින් නොමැති එහෙත් වාහනයට සවි කරන ලද, සූර්ය විදුලි පැනල මගින් උත්පාදනය වන විදුලියෙන් ආරෝපණය වන ඇකියුම්ලේටර් මගින් පමණක් බල ගැන්වෙන විදුලි මෝටර් මගින් ධාවනය වන | 30% |
| 23 | 87039032 | අවුරුදු තුනකට වඩා පැරණි, විදුලි බලයෙන් ක්‍රියාකරන අනෙකුත් අභ්‍යන්තර දහන එංජින් නොමැති එහෙත්, බාහිර විදුලි ප්‍රභවයන් (උදා: ජාතික විදුලි පද්ධතිය) මගින් ආරෝපණය වන වාහනයට සවි කරන ලද, ඇකියුම්ලේටර් මගින් බල ගැන්වෙන විදුලි මෝටර් මගින් ධාවනය වන | 30% |
| 24 | 87039033 | අවුරුදු තුනකට වඩා පැරණි, විදුලි බලයෙන් ක්‍රියාකරන අනෙකුත් බාහිර විදුලි ප්‍රභවයන් (උදා: ජාතික විදුලි පද්ධතිය) මගින් ආරෝපණය වන වාහනයට සවි කරන ලද, ඇකියුම්ලේටර් මගින් බල ගැන්වෙන විදුලි මෝටර් මගින් ධාවනය වන හා ජෙනරේටරය ධාවනය කිරීමෙන් විදුලිය උත්පාදනය කර ගැනීම සඳහාම පමණක් යොදාගත හැකි අභ්‍යන්තර දහන එංජිමක් සහිත | 30% |
| 25 | 87039039 | අනෙකුත් : | 30% |
| 26 | 87039091 | අනෙකුත් :අවුරුදු තුනකට වඩා නොපැරණි | 15% |
| 27 | 87039092 | අනෙකුත් :අවුරුදු තුනකට වඩා පැරණි | 30% |
| 28 | 87051010 | දොඹකර ලොරි අවුරුදු දහයකට වඩා නොපැරණි | නිදහස් |
| 29 | 87051020 | දොඹකර ලොරි අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 30 | 87054010 | කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි අවුරුදු දහයකට වඩා නොපැරණි | නිදහස් |
| 31 | 87054020 | කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 32 | 87059091 | අනෙකුත් දළ වාහන බර ටොන් 4 නොඉක්මවූ අවුරුදු හතකට වඩා නොපැරණි | නිදහස් |
| 33 | 87059092 | අනෙකුත් දළ වාහන බර ටොන් 4 නොඉක්මවූ අවුරුදු හතකට වඩා පැරණි | නිදහස් |
| 64 | 87059093 | අනෙකුත් :දළ වාහන බර ටොන් 4 ඉක්මවූ අවුරුදු හතකට වඩා නොපැරණි | නිදහස් |
| 35 | 87059094 | අනෙකුත් :දළ වාහන බර ටොන් 4 ඉක්මවූ අවුරුදු හතකට වඩා පැරණි | නිදහස් |
| 36 | 87042220 | අනෙකුත් : | නිදහස් |
| 37 | 87042230 | අනෙකුත් : | නිදහස් |
| 38 | 87043220 | අනෙකුත් : | නිදහස් |
| 39 | 87043230 | අනෙකුත් : | නිදහස් |

2015 දී 0% සිට 25% වූ සාමාන්‍ය බදු පිළිවෙලින් 0% සිට 30% දක්වා සංශෝධන කර ඇත.

*මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## 4.2 වගුව - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ (SAFTA) තීරුබදු නිදහස් කිරීම - 2015

| අංකය | ඌන සංවර්ධිත රටවලින් කරන ලද ආනයන සඳහා | | සියලුම ආනයන සඳහා | |
|---|---|---|---|---|
| | තීරුබදු කාණ්ඩ | තීරුබදු කාණ්ඩ සංඛ්‍යාව | තීරුබදු කාණ්ඩ | තීරුබදු කාණ්ඩ සංඛ්‍යාව |
| 1 | නිදහස් | 3,253 | නිදහස් | 2,590 |
| 2 | 4% | 131 | 1.5% | 142 |
| 3 | 4.5% | 1 | 2.5% | 6 |
| 4 | 5% | 1,544 | 4.5% | 1,258 |
| 5 | 6.75% | 2 | 5% | 455 |
| 6 | 8.5% | 20 | 7.5% | 1 |
| 7 | 9% | 2 | 22.4% | 1 |
| 8 | 12.5% | 32 | 23.8% | 11 |
| 9 | 13.5% | 19 | 25% | 1 |
| 10 | කැපූ කොටසක් සඳහා 25.2% හෝ රු. 100,000/= | 1 | 25.2% | 2 |
| 11 | කැපූ කොටසක් සඳහා 5% හෝ රු. 20,000/= | 1 | 27% | 3 |
| 12 | ලීටරයක් සඳහා 5% හෝ රු. 118/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 4.5% හෝ රු. 4.50 | 5 |
| 13 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 12/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 4.8% හෝ රු. 6/= | 1 |
| 14 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු.13/= | 1 | කැපූ කොටසක් සඳහා 5% හෝ රු. 20,000/= | 1 |
| 15 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 23/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 5/= | 6 |
| 16 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 26/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 7/= | 1 |
| 17 | ඒකකයක් සඳහා 5% හෝ රු. 54/= | 1 | ලීටරයක් සඳහා 5% හෝ රු. 118/= | 1 |
| 18 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 6/= | 2 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 12/= | 1 |
| 19 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 9/= | 5 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 13/= | 1 |
| 20 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු . 10/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 23/= | 1 |
| 21 | යුගලක් සඳහා 5% හෝ රු. 10/= | 2 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 26/= | 1 |
| 22 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 17/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 54/= | 1 |
| 23 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 19/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 6/= | 2 |
| 24 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 20/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 9/= | 5 |
| 25 | ඒකකයක් සඳහා 5% හෝ රු. 3617/= | 4 | කි. ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 10/= | 1 |
| 26 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 5/= | 5 | යුගලක් සඳහා5% හෝ රු. 10/= | 2 |
| 27 | ඒකකයක් සඳහා 5% හෝ රු. 56/= | 1 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 17/= | 1 |
| 28 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 7/= | 2 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 19/= | 1 |
| 29 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 40/= | 2 | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු. 20/= | 1 |
| 30 | කිසිදු තීරුබදු කාණ්ඩයකට අයත් නොවන | 1,926 | ඒකකයක් සඳහා 5% හෝ රු.3617/= | 4 |
| 31 | | | කි.ග්‍රෑ. 1 ක් සඳහා 5% හෝ රු.40/= | 2 |

| | | | | |
|---|---|---|---|---|
| 32 | | | ඒකකයක් සඳහා 5% හෝ රු. 56/= | 1 |
| 34 | | | කිසිදු තීරුබදු කාණ්ඩයකට අයත් නොවන | 2,455 |
| 35 | එකතුව | **6,965** | එකතුව | **6,965** |

*මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

දකුණු ආසියාතික නිදහස් වෙළඳ කලාප ගිවිසුම යටතේ 14.6% හා 10.83% යන බදු දෙකම 5%. දක්වා අඩුකර ඇත. එසේම, තෝරාගත් භාණ්ඩ සමහරක් සඳහා 14.6% හා 10.83% ක් වූ බදු පිළිවෙලින් 12.5% හා 8.5%.දක්වා අඩුකර ඇත.

ඇමුණුම - III

**4.3 වගුව - 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත (රේගු ආනයන තීරු බදු)**

| අංකය | ආදායම් සංරක්ෂණ පනත /අංකය/ විස්තරය | ගැසට් අංකය හා දිනය | බලාත්මක දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | RPO/01/2015 | 29.01.2015 දිනැති අංක 1899/33 දරන ගැසට් පත්‍රය | 30.01.2015 | අතුරු අයවැය යෝජනා යටතේ රේගු ආනයන බදු වෙනස්වීම (සිමෙන්ති හා වානේ ආනයනය තීරු බදු වලින් නිදහස්විය.) |
| 2 | RPO/02/2015 | 1903/40 දිනැති 26.02.2015 දරන ගැසට් පත්‍රය | 27.02.2015 | මෝටර් රථ ආනයනය සඳහා වයස් සීමාව (ආනයන බලපත්‍ර නොමැතිව) වැඩිකරන ලදි. (කාර් සඳහා අවු. 2 සිට 3, බස්රථ - අවු.5 සිට 10) |
| 3 | RPO/03/2015 | 2015.05.05 දිනැති අංක 1913/3 දරන ගැසට් පත්‍රය | 06.05.2015 | සහල් සඳහා නැවතත් රේගු තීරු බදු පනවනු ලැබීය (කි.ග්‍රෑ. 1 ක් සඳහා රු. 35/=) |
| 4 | RPO/04/2015 | 2015.11.20 දිනැති අංක 1941/42 දරන ගැසට් පත්‍රය | 21.11.2015 | 2016 අයවැය යෝජනා යටතේ බදු වෙනස්වීම්<br>1. කාණ්ඩ 03කින් යුත් තීරුබදු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය (0, 15%, 30%)<br>2. 7.5% සිට 0 දක්වා අඩු කරන ලදි<br>3. 25% සිට 30% දක්වා වැඩි කරන ලදි<br>4. දකුණු ආසියාතික නිදහස් වෙළඳ කලාප ගිවිසුම යටතේ අදාල බදු වෙනස් කිරීම්<br>5. මධ්‍යසාර පාන වර්ග, රිම් ප්‍රමාණය අඟල් 20 ට වැඩි ටයර්, චොක්ලට් සඳහා රේගු තීරු බදු වැඩිකරන ලදි<br>6. නිම් රෙදිපිලි, සපත්තු, ටයිල්, වානේ, සංගීත භාණ්ඩ, බඩ ඉරිඟු සඳහා රේගු තීරු බදු අඩුකරන ලදි<br>7. නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හඳුන්වාදීම (සුවද විලවුන්, විශාලකල හැකි ටියුබ්, විද්‍යුත් මෝටර් රථ, විශේෂ කාර්ය වාහන සඳහා) |

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් සංශෝධන | | | | |
| 1 | 2003 අංක 03 දරණ රේගු (සංශෝධන) පනතේ "ඉ" උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ පනවනු ලැබූ නියෝග | 1. 2015.01.29 දිනැති අංක 1899/35 දරන ගැසට් පත්‍රය<br>2. 2015.02.10 දිනැති අංක 1901/3 දරන ගැසට් පත්‍රය | 30.01.2015<br>10.02.2015 | මෝටර් රථවල තක්සේරු වටිනාකම් නිර්ණය කිරීමේ ක්‍රමය වෙනස් කරන ලදි. |
| 2 | | 3. 2015.09.22 දිනැති අංක 1933/18 දරන ගැසට් පත්‍රය | 17.09.2015 | |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2015*

ඇමුණුම - IV

## 4.4 වගුව - 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන සංශෝධන

| | ගැසට් අංකය | දිනය | භාණ්ඩ | බදු සංශෝධන |
|---|---|---|---|---|
| 1 | 1898/43 | 22.01.2015 | සහල් | කි.ග්‍රෑ. 1 ක් සඳහා වන බදු ප්‍රමාණය රු.. 1/= සිට රු. 20/- දක්වා වැඩි කරන ලදි. |
| 2 | 1899/32 | 29.01.2015 | හාල්මැස්සන්, මුංඇට, ටින්මාළු, උම්බලකඩ, කොත්තමල්ලි, කඩල, සීනි, මිරිස්, කහ, | භාණ්ඩ 10 ක් සඳහා බදු අඩු කරන ලදි. (අන්තර් වාර අයවැය යෝජනා) |
| 3 | 1901/28 | 14.02.2015 | මැකරල් මාළු හා අර්තාපල් | අර්තාපල් සඳහා වන බද්ද රු. 10/= සිට රු. 40/= දක්වා වැඩිකරන ලද අතර මැකරල් මාළු සඳහා බදු වලංගු කාලය දීර්ඝ කරන ලදි. |
| 4 | 1903/4 | 24.02.2015 | වටානා, කඩල, කව්පි, පරිප්පු, කුරක්කන්, මාගරින් | වලංගු කාලය මාස 6 කින් දීර්ඝ කරන ලදි. |
| 5 | 1906/7 | 17.03.2015 | මැකරල් මාළු | බදු ප්‍රමාණය රු. 10/=සිට රු.6/= දක්වා අඩු කරන ලදි. |
| 6 | 1907/19 | 25.03.2015 | සහල් | බදු ප්‍රමාණය රු. 20/= සිට රු.40/- දක්වා වැඩි කරන ලදි. |
| 7 | 1908/29 | 01.04.2015 | භාණ්ඩ 17 ක් සඳහා | වලංගු කාලය මාස 6 කින් දීර්ඝ කරන ලදි. |
| 8 | 1911/9 | 23.04.2015 | අර්තාපල්, ලොකුළූණු | අර්තාපල් කිලෝවක් සඳහා වන බද්ද 40/= සිට රු. 55/= දක්වාත් ලොක්ළූණු සඳහා රු. 10/= සිට රු. 30/= දක්වාත් වැඩි කරන ලදි. |
| 9 | 1913/2 | 05.05.2015 | සහල් | සහල් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කරන ලදි. |
| 10 | 1917/48 | 05.06.2015 | අර්තාපල්, ලොකුළූණු | අර්තාපල් කිලෝවක් සඳහා වන බද්ද 55/= සිට රු. 30/= දක්වාත් ලොකුළූණු සඳහා රු. 30/= සිට රු. 10/= දක්වාත් අඩු කරන ලදි. |
| 11 | 1919/33 | 16.06.2015 | පියලි කරන ලද පරිප්පු හා එලවළු තෙල් | අර්තාපල් සඳහා බදු ප්‍රමාණය රු.30/- සිට රු.40/- දක්වාත් සීනි සඳහා රු.18/- සිට රු.30/- දක්වාත් වැඩිකරන ලද අතර අනෙක් භාණ්ඩ සඳහා වලංගු කාලය (මාස 6 ක් ) දීර්ඝ කරන ලදි. |
| 12 | 1921/7 | 29.06.2015 | බඩඉරිගු | නැවතත් විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| 13 | 1924/9 | 20.07.2015 | හාල්මැස්සන්, මුංඇට, ටින්මාළු, උම්බලකඩ, කොත්තමල්ලි, උඳු, සීනි, මිරිස්, කහ, එලවළු තෙල් | භාණ්ඩ 10 ක් සඳහා වලංගු කාලය දීර්ඝ කරන ලද අතර එලවළු තෙල් සඳහා වන බද්ද රු.105/= සිට රු.90 /= දක්වා අඩු කරන ලදි. |
| 14 | 1931/7 | 07.09.2015 | අර්තාපල්, ලොකුළූණු, peas, කඩල, කව්පි, පරිප්පු, කුරක්කන්, මාගරින්, සීනි | අර්තාපල් සඳහා බදු ප්‍රමාණය රු.30/- සිට රු.40/- දක්වාත් සීනි සඳහා රු.18/- සිට රු.30/- දක්වාත් වැඩිකරන ලද අතර අනෙක් භාණ්ඩ සඳහා වලංගු කාලය (මාස 6 ක් ) දීර්ඝ කරන ලදි. |
| 15 | 1932/54 | 17.09.2015 | මැකරල් මාළු | වලංගු කාලය මාස 6 කින් දීර්ඝ කරන ලදි. (බදු ප්‍රමාණය රු.6/-) |
| 16 | 1933/15 | 22.09.2015 | ලොකුළූණු | දේශීය ගොවියා ආරක්ෂා කිරීම සඳහා කිලෝවකට රු. 20/= ක අධිභාරයක් පනවනු ලැබීය. |
| 17 | 1933/18 | 22.09.2015 | එලවළු තෙල් | ශුද්ධ නොකරන ලද පාම්තෙල් සඳහා වන බද්ද රු. 90/= සිට රු. 110/= දක්වාත් ශුද්ධ කරන ලද පාම් තෙල් සඳහා රු.. 110/= සිට රු. 130/=.දක්වාත් වැඩි |
| 18 | 1934/32 | 01.10.1015 | භාණ්ඩ 17 ක් සඳහා | වලංගු කාලය මාස 6 කින් දීර්ඝ කරන ලදි. |
| 19 | 1935/45 | 09.10.2015 | ලොකුළූණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සඳහා රු.20/- ක අධිභාරයක් එකතු කර රු.30/- දක්වා වැඩි කරන |
| 20 | 1938/4 | 28.10.2015 | බඩඉරිගු, එලවළු තෙල් | එලවළු මේදය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවනු ලැබූ අතර (කි.ග්‍රෑ. 1 ක් සඳහා රු.175/- ක් ) බඩඉරිගු සඳහා වලංගු කාලය දීර්ඝ කරනු ලැබීය. |
| 21 | 1941/43 | 20.11.2015 | මාළු, අර්තාපල්, ලොකුළූණු, පරිප්පු, රටඉඳි | 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කරනු ලැබිය. |

*මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2015*

ඇමුණුම - V

### 4.5 වගුව - විගණන විමසුම් - රජයේ විගණන - 2015

| අංකය | ලැබුණු දිනය | මාතෘකාව | පිළිතුරු ලබාදුන් දිනය |
|---|---|---|---|
| 1 | 2015.05.12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'B" ගිණුම 2014 විෂය අංකය –- 24401 | 2015.05.19 |
| 2 | 2015.05.15 | විසර්ජන ගිණුම 2014 – ශීර්ෂය 244 | 2015.05.27 |
| 3 | 2015.05.20 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය – 2013 | 2015.09.03 |
| 4 | 2015.05.27 | විගණනය සඳහා තොරතුරු ලබාගැනීම - 2014 | 2015.06.16 |
| 5 | 2015.06.08 | විගණනය සඳහා තොරතුරු ලබාගැනීම - 2014 | 2015.07.20 |
| 6 | 2015.07.07 | විගණනය සඳහා තොරතුරු ලබාගැනීම | 2015.07.21 |
| 7 | 2015.07.21 | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | 2015.08.10 |
| 8 | 2015.07.08 | කාර්ය මණ්ඩල පිළිබඳ පරීක්ෂාව- 2014 | 2015.08.04 |
| 9 | 2015.07.27 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2014 | 2015.08.10 |
| 10 | 2015.07.27 | කාර්යසාධනය 2014 | 2015.08.21 |
| 11 | 2015.07.28 | රේගු ආඥා පනතේ 19 (අ) රජයේ ප්‍රතිපත්ති හා රීති යටතේ බදු අත්හැරීම් හා බදු නිදහස් ලබාදීම | 2015.08.31 |
| 12 | 2015.08.25 | ශීර්ෂය 244 – විගණන හා කළමනාකරණ වාර්තාව - 2014 | 2015.10.05 |

| | | | |
|---|---|---|---|
| 13 | 2015.08.25 | ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2014 සඳහා විගණකාධිපති වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය | 2015.09.16 |
| 14 | 2015.09.16 | විගණනය සඳහා ලේඛන ලබාගැනීම | 2015.09.21 |
| 15 | 2015.10.21 | විගණනය සඳහා ලේඛන ලබාගැනීම | 2015.10.30 |
| 16 | 2015.11.11 | විගණනය සඳහා ලේඛන ලබාගැනීම | 2015.11.20 |
| 17 | 2015.12.08 | විදේශ ගමන් සඳහා වියදම් පරීක්ෂා කිරීම | 2016.01.26 |
| 18 | 2015.12.11 | විගණනය සඳහා ලේඛන ලබාගැනීම | 2015.12.18 |
| 19 | 2015.12.29 | විගණනය සඳහා ලේඛන ලබාගැනීම | 2016.01.11 |

*මූලාශ්‍රය -වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2015*

ඇමුණුම - VI

**4.6 වගුව - විගණන විමසුම් - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - 2015**

| අංකය | ලැබුණු දිනය | මාතෘකාව | පිළිතුරු ලබාදුන් දිනය |
|---|---|---|---|
| 1 | 2015.04.08 | ක්‍රියාකාරි සැලැස්ම - පළමු කාර්තුවේ ප්‍රගතිය | 2015.05.08 |
| 2 | 2015.05.12 | කළමනාකරණ විගණන වාර්තාව පළමු කාර්තුව – 2015 (වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව) | 2015.06.22 |
| 3 | 2015.06.22 | ක්‍රියාකාරි සැලැස්ම - දෙවන කාර්තුවේ ප්‍රගතිය | 2015.09.04 |
| 4 | 2015.08.03 | දෙවන කාර්තුවට අදාල කළමනාකරණ විගණන වාර්තාව (වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව) | 2015.09.25 |
| 5 | 2015.09.16 | ක්‍රියාකාරි සැලැස්ම - තෙවන කාර්තුවේ ප්‍රගතිය | 2016.02.19 |
| 6 | 2015.10.01 | 2015 තෙවන කාර්තුව විගණන කළමනාකරණයට අදාල තොරතුරු ලබා ගැනීම | 2015.10.28 |
| 7 | 2015.10.20 | තෙවන කාර්තුවේ කළමනාකරණ විගණන වාර්තාව - 2015 | 2016.02.23 |
| 8 | 2016.02.09 | ක්‍රියාකාරි සැලැස්ම අනුව හතරවන කාර්තුවේ ප්‍රගතිය | 2016.03.19 |
| 9 | 2016.02.16 | 2015 හතරවන කාර්තුවේ විගණන කටයුතු හා සම්බන්ධව තොරතුරු ලබා ගැනීම | 2016.02.17 |
| 10 | 2016.02.17 | 2015 තුන්වන කාර්තුවේ විගණන කටයුතු හා සම්බන්ධව තොරතුරු ලබා ගැනීම | 2016.02.17 |

*මූලාශ්‍රය -වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2015*

❊❊ ❊ ❊❊